# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 158 — 1975 අප්‍රේල් 04 වැනි සිකුරාද — 1975.04.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 223 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 238 |
| කනකුරු—ඇබෑර්තු ... ... ... | 224 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 227 | දේපල විකිණීම ... ... ... | — |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | 228 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 238 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥපනත

(257 වන අධිකාරය වූ) ගම්සභා ආඥපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය පිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ මැදපත්තු ගම් සභා ප්‍රදේශය තුළ ඒ වගන්තිය යටතේ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් සභාවේ පාලන නිලධරයාට මේ නිවේදනයෙන් බලය පවරමි.

පීළි. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

1975 මාර්තු මස 19 දින,
කොළඹ දී ය.

4-44—75. 04. 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### මන්නාරම නගරය

#### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මන්නාරම නගරය සඳහා වූ විශේෂ කොමසාරිස් විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, එකී වගන්තියේ 2 වැනි උපවගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

#### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මන්නාරම නගරය සඳහා වූ විශේෂ කොමසාරිස්වරයා විසින් එම නගරයේ පරිපාලන සීමා ඇතුලත වූ ප්‍රදේශයේ පැවැත්වෙන (එම ආඥපනතෙහි අර්ථ නිරූපනය කරන ලද පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කෙරෙන සියළුම ගෙවීම් වලින් 1957 දෙසැම්බර් 5 වැනි දින අංක 9,806 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන්

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවනු ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 දෙසැම්බර් 15 වැනි දින,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

එබඳු ගෙවීම් සඳහා පනවා අය කරන ලද බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

### ගෙවන මුදල

### බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව

| | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (1) ශත 20 ට නොඅඩු නමුත් ශත 40 ට වැඩි නොවන විට ... | ... 0 05 |
| (2) ශත 40 ට වැඩිවන නමුත් ශත 90 ට වැඩි නොවන විට ... | ... 0 10 |
| (3) ශත 90 ට වැඩිවන නමුත් රු. 1.40 ට වැඩි නොවන විට ... | ... 0 20 |
| (4) රු. 1.40 ට වැඩිවන නමුත් රු. 1.90 ට වැඩි නොවන විට ... | ... 0 30 |
| (5) රු. 1.90 ට වැඩිවන නමුත් රු. 3.00 ට වැඩි නොවන විට ... | ... 0 40 |
| (6) රු. 3.00 ට වැඩි වන නමුත් රු. 4.00 ට වැඩි නොවන විට ... | ... 0 60 |
| (7) රු. 4.00 ට වැඩිවන නමුත් රු. 5.00 ට වැඩි නොවන විට ... | ... 0 80 |
| (8) රු. 5.00 ට වැඩිවන නමුත් රු. 10.00 ට වැඩි නොවන විට ... | ... 1 0 |
| (9) රු. 10.00 ට වැඩිවන විට— | |
| (i) පළමුවන රු. 10.00 ට | ... 1 0 |
| (ii) සෑම අතිරේක රු. 5.00 ට හෝ ඉන් කොටසකට ... | ... 1 0 |

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

4–37—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### යටියන්තොට නගරය

### සුළු නගර සභා ආඥපනත

### 1975 වර්ෂය සඳහා දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 159 (1) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, විශේෂ කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම්, විශේෂ යෙන් හා කොන්දේසිවලට යටත්ව, යටියන්තොට නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට නවය බැගින් වූ වට්පනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන් හි දී සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කළ හැකි අන්දමට 1975 වර්ෂය සඳහා යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 මාර්තු මස 03 දින,
කොළඹ දී ය.

4–36—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු—ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය IV වැනි කොටසේ පළකෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

3. **සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි.**— (අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිලධාරිතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාමගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරණු ලබන්නේ, 1969 අංක 18 දරණ පලාත්පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුළින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියමකළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**— (i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නාවූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීති වලට එකඟවීමේ කොන්දේසියට සියළුම නව ප්‍රවේශක නිළධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහිලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වනතුරු නියමිත වැටුප් වැඩිවීම නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබාගැනීමට අසමත්වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාළන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදළ වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට, පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැළිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක' නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදළ නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාල්න සේවයේ තනතුරු සම්බන්ධ යෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(I) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිළධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යු තුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී , ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට සූදනම් ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.'

(IV) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂන්යෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක්ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(V) යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුසුස්සකු ටවට පත්කරවනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වූනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(VI) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(VII) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවාකොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(VIII) අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේ දී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා වලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කෙරෙන අයදුම්කරුවෝ තුමූම ඒ අවදනමට මුහුණපාති

### අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිතා කළ යුතු අයදුම් පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ.යු.—(I) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(II) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(III) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (i) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(IV) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

.............................. **තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය ;————.
   (ආ) ඉල්ලුම් කරසිටින තනතුර ;————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් ;————.
   ජාතිය ;————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන කරන්න).

3. තැපැල් ලිපිනය ;————.
   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස ;————.
   අවුරුදු ;————. මාස ;————. දින ;————.
   (ආ) උපන් දිනය ;—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ශ්‍රී ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ශ්‍රී ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය).

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස් ම විභාගය :—

(i) සිංහල :————,

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :————.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන්:————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න:—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද ? :————,

(ඉ) සේවාමුක්ත භටයෙක් නම්—සේනාංකය, කරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානුව සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත් තනතුරු දරණ සාමාජිකයින් විසින් මෙ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මෙ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබුමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස් සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.
තැ.පෙ. 530, කොළඹ 1.

### පළාත් පාලන සේවය

#### යන්ත්‍ර සහ උපකරණ පිළිබඳ අධිකාරි තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා අධ්‍යක්ෂ විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 8,280ක වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් සහිත වර්ෂයකට රු. 6,600—180×8 සහ 240×5—රු. 9,240 යන වැටුප් ක්‍රමය මෙම තනතුරට අදාල වේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—1975.05.23 දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (මෙම වයස් සීමාව පළාත් පාලන සේවකයන්ට අදාළ නොවේ)

(ආ) අයදුම්කරුවන් යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 6ක් සහිතව හෝ සමත් වී තිබිය යුතුය.

(ඇ) පිළිගත් ගරාජයක හෝ කර්මාන්ත ශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 5ක ආධුනික සේවා කාලයක් තිබිය යුතුය.

(ඈ) ආධුනික කාලයට පසුව, ගරාජයක පහත සඳහන් අංශවලින් කිසියම් අංශයක ෆෝර්මන්වරයකු වශයෙන් අවුරුදු 5ක පළපුරුද්ද තිබිය යුතුය :—

(1) ලොරිවල විශාල අළුත්වැඩියා කිරීම් පිළිබඳ අංශය.

(2) විදුලිය අංශය.

(3) සුළු අළුත්වැඩියා කිරීම් අංශය.

(4) මැෂින් අංශය.

(5) කම්මල් වැඩ අංශය.

(6) පින්තාරු අංශය.

(ඉ) ගබඩා පාලනය පිළිබඳ සාමාන්‍ය දැනීමක් තිබිය යුතු අතර, වාහන අමතර කොටස් මිළට ගැනීම පිළිබඳව හැසෙන දැනීමක් තිබිය යුතුය.

(ඊ) ලොරි ඇතුළුව මෝටර් රථ පැදවීමේ ප්‍රවීණතාව පිළිබඳ වලංගු සහතිකයක් අයදුම්කරුවන්ට තිබිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර—පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1975.05.23 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළ හොත් පමණි.

7. සුදුසු අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

කොළඹ, තැ. පෙ. 530, 19, ලොංඩන් පෙදෙස,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.
1975.03.27.

4-107 —75.04.04 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

පළාත් පාලන සේවා සරප් සහ කැෂියර්වරුන්ගේ සේවයේ(III)ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 1974.06.08 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීම් සඳහා කුශලතාවය පිළිවලට පහත සඳහන් අපේක්ෂකයින් තෝරා ගනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

| විභාග අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 06 ... | එස් කේ. ධර්මසේන මහතා ... | ''ජයන්තා'', පොතුපිටිය, වාද්දුව දකුණ |
| 11 ... | එස්. ඒ. ජයන්ති මෙනවිය ... | බක්මීගහවත්ත, යදන්හිමුල්ල, උනවටුන, ගාල්ල |
| 10 ... | එම්. ඩී. ගුණසෝම මහතා ... | 19/ඒ, කයිලගොඩ, බදුල්ල |
| 07 ... | එල්. ජේ. ඒ. එල්. ද සිල්වා මහතා | 329, පන්නල ගෙදර, වෙයන්ගොඩ |

ආර්. අබේරත්න,
අධ්‍යක්ෂ,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව.

1975 මාර්තු මස 24 වන දින,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව,
19, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7.

4-110—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1974 අගෝස්තු 03 සහ 05 දිනයන්හි පැවැත්වූ I, II, හා III, ශ්‍රේණිවල විදුලි අධිකාරින්ගේ ක.කා.ඉ. පරීක්ෂණයේ ප්‍රතිඵල

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහත දක්වේ ;—

**I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

| ඇතුළත් වීමේ අංකය | නම | පළාත් පාලන ආයතනය | සමත් වූ විෂයයන් |
|---|---|---|---|
| 3 ... | *ඩබ්. ජී. බී. ඩබ්. ගුණතිලක | ... දෙහිවල නාගරික | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්—73<br>2. විදුලි ඉංජි. I<br>3. විදුලි ඉංජි. II—73 |

**II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

| ඇතුළත් වීමේ අංකය | නම | පළාත් පාලන ආයතනය | සමත් වූ විෂයයන් |
|---|---|---|---|
| 4 ... | *පී. ජයරත්නසිංහම් | ... දික්ඔය පු. ස. ස. | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්—73<br>2. විදුලි ඉංජි. I<br>3. විදුලි ඉංජි. II—73 |
| 5 ... | පී. තංගයනාදන් | ... හම්බන්තොට ප. ආ. ස. | ... 1. විදුලි ඉංජි. I<br>2. විදුලි ඉංජි. II |
| 7 ... | *වී. නවරත්නරාජා | ... ගම්පහ ප. ආ. ස. | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්—<br>2. විදුලි ඉංජි. I<br>3. විදුලි ඉංජි. II |
| 8 ... | එස්. නගුලේස්වරන් | ... කඩුගන්නාව ප. ආ. ස. | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්<br>2. විදුලි ඉංජි. I |
| 10 ... | *එස්. පරමේශ්වරන් | ... කළුතර ප. ආ. ස. | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්<br>2. විදුලි ඉංජි. I<br>3. විදුලි ඉංජි. II—73 |
| 11 ... | *සී. ත්‍යාගරාජා | ... ජාඇල ප. ආ. ස. | ... 1. දෙපාර්තමේන්තු සංවිධාන හා මුදල්—73<br>2. විදුලි ඉංජි. I<br>3. විදුලි ඉංජි. II—73 |

* සම්පූර්ණ කාර්යක්ෂමතා කඩඉම

| ඇතුලත්වීමේ අංකය | නම | පලාත් පාලන ආයතනය | සමත්වූ විෂයයන් |
|---|---|---|---|
| III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | | | |
| 23 | ජෝ. පු. දල්පතාදු | කදාන පු. න. ස. | 1. විදුලි ඉංජි. II |
| 27 | එම්. සී. කේ. ගුණතිලක | කුලුගම්මන සියපත්තු ග. ස. | 1. විදුලි ඉංජි. II |
| 33 | කේ. ජයතිලක | බෙරුවල ප. ආ. ස. | 1. විදුලි ඉංජි. II |
| 44 | එල්. ඩී. පුණ්‍යසිරි | කෑගල්ල ප. ආ. ස. | 1. විදුලි ඉංජි. II |
| 48 | වී. රෙංගනාදන් | අක්කරපත්තුව මැද ග. ස. | 1. විදුලි ඉංජි. II |
| 49 | වී. සිවපාදසුන්දරම් | වාවකච්චෙරි ග. ස. | 1. විදුලි ඉංජි. II |

ආර්. අබේරත්න.
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 24 වෙනි දින,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව
19, ලෝන්ඩන් පෙදෙස,
කොළඹ 7

4—111—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන සේවය

පළාත් පාලන ගබඩා භාරකරුවන්ගේ සේවයේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 1974.06.15 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීම් සඳහා කුශලතාවය පිළිවලට පහත සඳහන් අපේක්ෂකයින් තෝරාගනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| විභාග අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 31 | මා. ගා. ප්‍රනාන්දු | 37/2, පන්නල පාර, කලුතර උතුර. |
| 6 | පී. හේ. ධර්මදාස | 74/3, නිල්වලා පාර, තොටමුණ, මාතර |

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 24 වන දින,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව,
19, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7.

4–112—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන හා 156 වන වගන්ති යටතේ අළුත්ගම සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1957 මාර්තු මස 19 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව—මලාපවහන ගාස්තුව

(1) සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XIX කොටසේ 6 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සභාවට මාස් පතා ගෙවිය යුතු මලාපවහන ගාස්තුව, 1975 ජනවාරි මස 1 වැනිදා සිට, ශුද්ධ කරනු ලැබූ එක් එක් බාල්දිය සඳහා රුපියල් පහක් බැගින් විය යුතුය.

(2) 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු ඒ ගාස්තුව ලැබිය යුතු මාසයට පසු මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

4-108 —75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### යාපනය මහ නගර සභාව

#### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වන සහ 272 වන වගන්ති යටතේ යාපනය මහ නගර සභාව විසින්, සාදනු ලැබ ඒ ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975. 03. 13,
කොළඹ දීය.

#### කාණු උඩින් ප්‍රවේශ මාර්ග පාලනය කෙරෙන අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

"නාගරික ප්‍රදේශය" යන්නෙන් මහ නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ යාපනය නාගරික ප්‍රදේශ යයි ප්‍රකාශිත ප්‍රදේශ අදහස් වේ. තවද, "නගරාධිපති" යන්නෙන් යාපනය මහ නගර සභාවේ නගරාධිපති අදහස් වේ.

2. නාගරික ප්‍රදේශය ඇතුළත පැත්තකින් කාණුවක් තනා ඇති යම් වීදියක ට යාබද යම් ගෘහයක, ඉඩමක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු, නගරාධිපතිගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ නගරාධිපති විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව සහ ඔහු විසින් විධාන කරනු ලබන ආකාරයකට මිස එවැනි කාණුවක් උඩින් යම් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් තැනීම හෝ පිහිටුවීම නො කළ යුතුය. එවැනි අවසරයක් ලබාගෙන එවැනි පාලමක් වේදිකාවක් හෝ ඉදිකිරීමක් තනා තිබෙන අවස්ථාවක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එය නගරාධිපති සෑහීමකට පත්වන ආකාරයට යහපත් තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය. යම් ගෘහයකට, ඉඩමකට හෝ ස්ථානයකට යම් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් නොමැතිව යම් තැනැත්තකුට ප්‍රවේශ මාර්ගයක් ඇතැයි නගරාධිපතිට දැනගන්නට ලැබෙතහොත් පාලමක්, වේදිකාවක් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් වහාම තනන ලෙස නගරාධිපති විසින් එහි අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් කිරීම නීත්‍යානුකූල වන්නේය. එවැනි යම් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් හෝ එහි යට ඇති යම් කාණුවක් යථා පරිදි නඩත්තු කිරීම යම් තැනැත්තකු පැහැර හරින විට එය නිසි තත්වයට පමුණුවන ලෙස අයිතිකරුට හෝ පදිංචිකරුට නගරාධිපති විසින් දැන්වීමක් කිරීම නීත්‍යානුකූල වන්නේය. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ යම් දැන්වීමක නියමයන්, එම දැන්වීම බාර දී දින තිහක් ඇතුලත ඉටු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර නගරාධිපති විසින් ඔහු වෙනුවෙන් කරන ලද යම් ඉදි කිරීමක හෝ නඩත්තු කිරීමක වියදම එම තැනැත්තා විසින් නගරාධිපති ට ගෙවිය යුතු ය.

3. පොදු කාණුවක් හෝ ඇළක් උඩින් වූ සෑම පාලමක්ම හෝ

අන්තර මගක් ම කොන්ක්‍රීට් වලින්, ගඩොල් වලින් හෝ නගරාධිපති විසින් අනුමත කරන ලද වෙනත් ද්‍රව්‍යයකින් තැනිය යුතු අතර කාණුවකට හෝ ඇළට ප්‍රවේශ වීම පිණිස ප්‍රමාණවත් උපක්‍රම සලසා තිබිය යුතු ය. එවැනි සෑම පාලමක් ම හෝ අන්තර මගක් ම කාණුවේ හෝ ඇළේ ගලා යෑමට බාධාවක් නොවන ආකාරයට තැනිය යුතු ය. පොදු කාණුවක් හෝ ඇලක්, උඩින් පදිංචියට ගන්නා නිවසක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ඉදි නො කළ යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථා යටතේ සෑම දැන්වීමක් ම බාර දීම නගර සභා ආඥාපනතේ විධි විධාන සලසා ඇති ආකාරයට කළ යුතු ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ද වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එවැනි කඩකිරීමක් ගැන අවධානය යොමු කරව මින් නගරාධිපතිගෙන් ලිඛිත නිවේදනයක් භාර දීමෙන් පසුව වරද කර ගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

4-113 —75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

**යාපනය මහ නගර සභාව**

මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වන සහ 272 වන වගන්ති යටතේ යාපනයේ මහ නගර සභාව විසින් සාදනු ලැබ ඒ ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

බී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975 මාර්තු 12 දින,
කොළඹ දීය.

**පදික මාරු සහ පදික වේදිකා පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. මේ අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

"පදික මාරු" යන්නෙන් වර්ණ රේඛා මගින් හෝ වෙනත් යම් ලෙසකින් යම් වීථියක සලකුණු කර තිබෙන්නා වූ පදික මගියන් සඳහා අදහස් කරන ලද මාරුවීමේ ස්ථානයක් අදහස් වේ.

2. පදික මාරුවක් කරා එන සෑම වාහනයකම රියදුරා, අවශ්‍ය වුවහොත් පදික මාරුවකට පැමිණීමට කලින් වාහනය නැවැත්වීමට හැකිවන තරම් වේගයෙන් පැමිණිය යුතු ය.

3. පොලිස් කොස්තාපල් කෙනෙකු විසින් හෝ ආලෝක සංඥා මගින් තත්කාලයේ දී රථවාහන පාලනය නොකෙරෙන, අවස්ථාවක පදික මාරුවක් කරා එන සෑම වාහනයක ම රියදුරා පදික මාරුවක මාර්ගාවතීර්ණ යම් පදික මගියකු ට නිදහස් ලෙස හා බාධා රහිතව මාර්ගය ඉඩ දිය යුතු ය. තවද, එවැනි පදික මාරුවක දී සියළුම රථවාහනවලට ඉහළින් පදික මගියා ට ප්‍රමුඛත්වය තිබිය යුතු ය.

4. යම් වාහනයක රියැදුරකු—

(අ) ඔහුට පාලනය කළ නොහැකි හේතු නිසා ඉදිරියට යාමෙන් ඔහු වැළැක්වී ඇති විට, හෝ

(ආ) හදිසි අනතුරක් වැළැක්වීම පිණිස ඔහුට වාහනය නැවැත්වීමට අවශ්‍ය විට මිස යම් පදික මාරුවක එම වාහනය නතර කිරීම නොකළ යුතු ය.

5. කිසිම පදික මගියෙක් වීදියේ එක් පැත්තක සිට අනෙක් පැත්තට සාධාරණ වේගයකින් මාරුවීම සඳහා අවශ්‍ය වන කාලයට වැඩි කාලයක් කිසිම පදික මාරුවක නො රැඳිය යුතු ය.

6. වීදියක් ඔස්සේ පයින් ගමන් කරන සෑම පදික මගියෙක් ම පදික වේදිකාවක් හෝ අඩි පාරක් ඇත්නම් එහි ගමන් කළ යුතු ය. එවැනි පදික වේදිකාවක් හෝ අඩි පාරක් නැත්නම්, ඔහු ගමන් කරන්නේ යම් දිසාවට මුහුණ ලාද එහි දකුණු පැත්තෙන් ගමන් කළ යුතුය.

7. මේ අතුරු ව්‍යවස්ථාවල යම් විධි විධානයක් කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

4—114 —75.04.04 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

**යාපනය මහ නගර සභාව**

මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වන සහ 272 වන වගන්ති යටතේ යාපනය මහ නගර සභාව විසින් සාදනු ලැබ, ඒ ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව, ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා.

බී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975. 03. 13,
කොළඹ දී ය.

**මාළු විකිණීමට අදාල අතුරු ව්‍යවස්ථා**

1. මේ අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"සභාව" යන්නෙන් යාපනය මහ නගර සභාව අදහස් වේ.

"නගරාධිපති" යන්නෙන් යාපනය මහ නගර සභාවේ නගරාධිපති අදහස් වේ.

"නාගරික ප්‍රදේශය" යන්නෙන් මහ නගර සභා ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ යාපනය නාගරික ප්‍රදේශය යයි ප්‍රකාශිත ප්‍රදේශය අදහස් වේ.

"බල පත්‍රධාරියා" යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව මාළු විකිණීමට යම් ස්ථානයක් හෝ තැනක් පාවිච්චි කිරීම සඳහා බලය පවරමින් නගරාධිපති විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් දරන තැනැත්තකු අදහස් වේ.

"බලය ලත් ස්ථානය" යන්නෙන් නගරාධිපති විසින් බල පත්‍රය නිකුත් කරන ලද්දේ යම් ස්ථානයක් හෝ තැනක් සම්බන්ධයෙන් ද ඒ සම්පූර්ණ ස්ථානය හෝ තැන අදහස් වේ.

2. (අ) කලින් කල සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමෙන් පසු නගරාධිපති විසින් ඒ සඳහා නිකුත් කරනු ලැබූ බල පත්‍රයක් ඇතිව මිස (පොදු වෙළඳ පළ හැර) වෙනත් යම් සාප්පුවක් හෝ තැනක් මාළු විකිණීම සඳහා කිසිම තැනැත්තකු විසින් පාවිච්චි නො කළ යුතු ය.

(ආ) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන සෑම බල පත්‍රයක් ම 7 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින එහි වලංගු කාලය අවසන් විය යුතු ය.

3. බලපත්‍ර ලැබීමට ඇති ස්ථානය පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව තිබේ නම් මිස මාළු වෙළඳ පිලක් තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නො තිබිය යුතු ය.

(අ) ස්ථානය හොඳින් අළුත්වැඩියා කොට මනා වාතාශ්‍රයෙන් හා ආලෝකයෙන් යුක්ත කොට තිබිය යුතු අතර, සෑම කාමරය කට ම විවෘත කළ හැකි ජනෙල් සපයා තිබිය යුතු ය. විවෘත කළ විට එක් එක් ජනේලයේ වර්ග ප්‍රමාණය මතුපිට බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් එකකට අඩු නොවිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම පැත්තම උසින් අඩි 7 කට අඩු නොවිය යුතු අතර පිහන් ගඩොල් ඇතිරීමෙන් හෝ සිමෙන්ති කපරාරුවෙන් ආවරණය කළ කොටස් හැර අනිත් කොටස් හුනු කපරාරුව යොදා හුනු පිරියම් කර තිබිය යුතු ය.

(ඇ) සියළුම පියසි කෙළවරවල් බිම සිට අඩි 6 කට නො අඩු උසින් තිබිය යුතු ය.

(ඈ) දැවයෙන් කළ කොටස් තෙල් සායම් ගා හෝ හුනු පිරියම් කර තිබිය යුතු ය.

(ඉ) බිම සිමෙන්තියෙන් තනා සිමෙන්ති ගාන ලද කාණුවකින් බාල්දියකට යොමු වන පරිදි නිසි බෑවුමක් ඇතිව මෘදු සිමෙන්තියෙන් තනන ලද්දක් විය යුතු ය.

(ඊ) මාළු තබන සෑම මේසයක් ම සින්ක් තහඩුවලින් හෝ වෙනත් දිය නාල්ලන ද්‍රව්‍යයකින් ආවරණය කරන ලද්දක් විය යුතු ය.

(ද) එම ස්ථානයෙහි සෞඛ්‍යාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය.

(ඳ) එම ස්ථානය යම් වැසිකිළියක, වැසිකිළි වළක, පෝර ගොඩක හෝ විවෘත කසළ කාණුවක සිට යටත් පිරිසෙයින් අඩි 50 ක් වත් ඈතින් පිහිටා තිබිය යුතු ය.

(ඵ) එම ස්ථානය ඇතුළත හෝ ස්ථානයට කෙළින්ම සම්බන්ධ වන වැසිකිළි වළක්, වැසිකිළියක් හෝ අලු වළක් එහි නොතිබිය යුතු ය.

4. (අ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියෙකු විසින්ම තම නම සහ "බලය ලත් මාළු වෙළඳ පිල" යන වචන පැහැදිලිව දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පින්තාරු කරන ලද පුවරුවක් තම ස්ථානයේ පිවන ප්‍රකටව පෙනෙන ස්ථානයට සවි කොට තැබිය යුතු ය.

(ආ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින්ම, මාළු වෙළඳ පිල්වලට අදාළ මෙම නියෝගවල දෙමළෙන්, සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් වූ පිටපතක් රාමු කොට, බලය ලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තබීමට සැලැස්විය යුතු ය. තවද සෑම විටකම පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි සංචාරක මාළු වෙළඳුන් ඇතුළු සියළුම සේවකයින්ගේ නම් සහ ලිපිනයන් දැක්වෙන ලැයිස්තුවක් ද ඔහු එම ස්ථානයේ තැබිය යුතු ය.

(ඇ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින්ම, යටත් පිරිසෙයින් අවුරුද්දකට හතර වරක්වත් මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවල දී සහ නගරාධිපති විසින් ලියවිල්ලකින් විධාන කරනු ලබන සෙසු අවස්ථාවන්හි දී, මාළු වෙළඳ පිල සමන්විත වන්නේ යම් කාමර වලින් ද ඒ සෑම කාමරයකම බිත්තිවල පිඟන් ගඩොලින් හෝ සිමෙන්ති කපරාරුවෙන් වැසුණු කොටස් හැර අනෙක් කොටස්වල හුණු පිරියම් කිරීමට ද, දැවයෙන් කළ සියලු කොටස්වලට හුණු පිරියම් කිරීමට හෝ ඒවායේ තෙල් සායම් ගා තිබේ නම් උණු වතුරෙන් හා සබන්වලින් සේදීමට ද සැලැස්විය යුතු ය.

(ඈ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින් ම බිම, බිත්තියේ ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති දැමූ කොටස්, මේසවල මතුපිට සහ මාළු කපන කොටන් දවසකට වරක් තදින් ඇතුල්ලා සේදීමට සැලැස්විය යුතු අතර, මාළු එල්ලා තබන කොකු සියල්ල මලකඩ විරහිත කොට මැද තැබීමට සැලැස්විය යුතු ය.

(ඉ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින්ම වෙළඳ පිලේ සෑම කොටසක්ම එහි වටාපිටාව කාණු, දැව බඩු, භාජන සහ මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම, හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන උපකරණ මනා ලෙස අළුත්වැඩියා කළ තත්ත්වයෙන් යුක්තව සහ පිරිසිදුව ද, යම් කාණුවකින්, වැසිකිළියකින්, වැසිකිළි වළකින් හෝ වෙනත් තැනකින් පැන නගින දුර්ගන්ධයෙන් තොරව ද තැබිය යුතු ය.

(ඊ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින්ම එම ස්ථානයෙහි සේවකයනට පහසුවෙන් යා හැකි තැනක සෞඛ්‍යාරක්ෂක කසළ භාජනයක් සහ යටත් පිරිසෙයින් එක් පඩික්කමක් වත් බලය ලත් ස්ථානයෙහි තැබීමට සැලැස්විය යුතු ය.

(උ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින් ම වෙළඳ හා ගෘහ කසළ වහාම සිදුරු රහිත, වසන ලද භාජනයක දමා දිනපතා එම බලය ලත් ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, නියම වශයෙන් එහි කසළ බහාලන හා එයින් ඉවත් කරන විට හැර අන් සෑම විටම එම භාජනය වසා තැබීමට සැලැස්විය යුතු ය.

(ඌ) මාළු වෙළඳ පිලක සෑම බලපත්‍රධාරියකු විසින්ම බලය ලත් ස්ථානය මීයන්ගෙන් තොරව තබා ගත යුතු අතර සියළුම මී ගුල් දුටු වහාම වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්ති බදාම දා වැසිය යුතු ය.

(එ) කිනම් හේතුවක් නිසා වත් යම් සතකු හෝ කුරුල්ලකු කිසිම තැනැත්තකු විසින් බලය ලත් ස්ථානයෙහි තබා නොගත යුතු ය.

(ඒ) කෙළ ගැසීම සඳහා තබා ඇති පඩික්කමට හැර කිසිම තැනැත්තකු විසින් වෙළඳ පිල ඇතුළත කෙළ නො ගැසිය යුතු ය.

(ඔ) යම් ආසාදක රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්මීය රෝගයකින් පෙළෙමින් සිටින හෝ ළඟ දී පෙලුණු හෝ එවැනි යම් රෝගයකින් පෙළෙන්නකු ට ළඟදී උපස්ථානයෙහි යෙදී සිටි කිසිම තැනැත්තකු මාළු වෙළඳ පිලකට ඇතුළුවීම හෝ මාලු සකස් කිරීමෙහි, පිළියෙල කිරීමෙහි, හෝ එහි තුළ මාළු විකිණීමෙහි හෝ එම ස්ථානයේ සිට හෝ එම ස්ථානය වෙත මාළු ප්‍රවාහණය කිරීමෙහි හෝ යෙදීම නොකළ යුතු ය.

(ඕ) මාළු ගබඩා කිරීමට, පිළියෙල කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරනු ලබන ඒවා හැර, කිසියම් දැව භාණ්ඩ, ඇඳුම්, පැලඳුම්, නිදන පැදුරු හෝ වෙනත් දේවල් කිසිම තැනැත්තකු විසින් බලය ලත් ස්ථානයෙහි ගනා නැබිය යුතු ය.

(ක) මාළු වෙළඳ පිල මට්ටමේම වූ ද, එම ගොඩනැගිල්ලේම කොටසක් වූ ද, යම් ස්ථානයක් නිදන ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීමට, එය නියත වශයෙන් ම බිම සිට සිලිම දක්වා මාළු වෙළඳ පිලෙන් වෙන් කොට තිබේ නම් සහ විවෘත කළ විට මතු පිට බිම් ප්‍රමාණයෙන් පහලෙවෙන් එකකට අඩු නොවන ප්‍රමාණයෙන් යුත් පිටත ජනේලයක් එම නිදන ස්ථානයට සපයා ඇත් නම් මිස මාලු වෙළඳ පිලක බලපත්‍රධාරියා විසින් අවසර නො දිය යුතු ය.

(ග) සෑම මාලු වෙළඳ පිලකම බලපත්‍රධාරියා විසින් එම බලය ලත් ස්ථානයෙහි සෑහෙන තරම් බිමට යෝග්‍ය පැන් සපයා තැබිය යුතු ය.

(ච) සෑම මාළු වෙළඳ පිලකම බලපත්‍රධාරියා විසින් බලය ලත් ස්ථානය මාළු විකිණීම පිණිස දිනපතා විවෘත කොට තැබිය යුතු ය.

(ජ) නගරාධිපති සහ බලපත්‍රධාරියා විසින් අත්සන් කරන ලද ලියාපදිංචි කිරීමේ පතක් තම සන්තකයෙහි තිබෙන තැනැත්තකුට මිස, කිසිම තැනැත්තකුට බලය ලත් ස්ථානයෙන් විකිණීම පිණිස මාළු ප්‍රවාහණය කිරීමට මාළු වෙළඳ පිලක බලපත්‍රධාරියා විසින් ඉඩ නොදිය යුතු ය.

(ට) ආවරණය කරන ලද වාහනයක හෝ වසන ලද කූඩයක, ටින් එකක හෝ වෙනත් සුදුසු භාජනයක හැර බලය ලත් ස්ථානයෙන් විකිණීම සඳහා මාළු ප්‍රවාහනය කිරීමට මාළු වෙළඳ පලක බලපත්‍රධාරියා විසින් යම් තැනැත්තකුට ඉඩ නොදිය යුතු ය. එවැනි සියළුම වාහන, කූඩා, ටින් හෝ වෙනත් භාජන සෑම අවස්ථාවේදීම පිරිසිදු තත්ත්වයකින් පවතින බවට බලපත්‍රධාරියා වග බලා ගත යුතු ය.

(ඩ) මාළු වෙළඳ පිලක බලපත්‍රධාරියාගේ ඉල්ලීම පිට නගරාධිපති විසින් විකිණීම සඳහා මාළු ප්‍රවාහනය කිරීමට එම බලපත්‍රලාභියා විසින් යොදවා ඇති සෑම තැනැත්තකුගේම ප්‍රයෝජනය පිණිස ලියාපදිංචි කිරීමේ පතක් නිකුත් කළ යුතු ය.

(ණ) කුඹලු මසුන් හැර, කෑමට ගන්නා මාළු කිරා මිස වෙනත් ආකාරයකින් බලපත්‍රධාරියා විසින් නොවිකිණිය යුතුය.

5. (අ) නගරාධිපති, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා, හෝ නගරාධිපති විසින් සාමාන්‍ය ආකාරයෙන් හෝ විශේෂ ආකාරයෙන් ලියවිල්ලකින් බලය පවරන ලද සභාවේ යම් නිලධාරියකු විසින් මාළු විකිණීම පිණිස යොදා ගෙන ඇති යම් සාප්පුවකට හෝ ස්ථානයකට සියලු සාධාරණ වේලාවන්හිදී ඇතුළු වී පරීක්ෂා කිරිම නීත්‍යානුකූල විය යුතු ය.

(ආ) බලපත්‍රධාරියා විසින් හෝ මාළු විකුණන සාප්පුව හෝ ස්ථානය භාර තැනැත්තා විසින් නගරාධිපතිට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියට හෝ නගරාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකුට එම ස්ථානය පරීක්ෂා කර බැලීම පිණිස එහි ඇතුළු වීමට ඉඩ දෙනු ලැබිය යුතු අතර, අවශ්‍ය විය හැකි සියළු සහාය ද නගරාධිපතිට හෝ එම නිලධරයාට දිය යුතු ය.

6. මාළු විකිණීමට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් පිළිබඳව කෙරෙන සෑම කඩකිරීමක්ම—

(i) පළමුවතාවට වරද කිරීමේ දී රුපියල් සියයකට වැඩි නොවන් නාවූ දඩයකින් ද,

(ii) දෙවෙනි වරට හෝ තදනන්තරව වරද කිරීමේ දී රුපියල් දෙසියයකට වැඩි නොවන්නාවූ දඩයකින් ද,

(iii) වරද දිගටම කර ගෙන යන අවස්ථාවන්හිදී එසේ උල්ලංඝනය කිරීම කෙරෙහා අවධානය යොමු කරවමින් නගරාධිපතිගෙන් ලිඛිත දැන්වීමක් බාර දීමෙන් පසු වරද කර ගෙන යන කාලයේ සෑම දිනයක් සඳහා ම රුපියල් විසි පහකට වැඩි නොවන අතිරේක දඩයකින් ද දඬුවම් ලැබිය යුතු ය.

7. මාළු විකිණීමට අදාළ වූ මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කිරිම සම්බන්ධයෙන් දෙවරක් හෝ නිරතුරුව වරදකරු කරනු ලැබූ බලපත්‍රධාරියකුගේ බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් පැනවිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව එම අධිකරණය මගින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එම අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිම වන්දියක් ලැබීමට එම බලපත්‍රධාරියාට හිමිකමක් නොතිබිය යුතු ය.

8. මේ අතුරු ව්‍යවස්ථා යටතේ යම් දැන්වීමක් බලපත්‍රලාභියාගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානයට ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබුවේ නම්, හෝ බලපත්‍රධාරියා සිය ව්‍යාපාරය පවත්වා ගෙන යන ස්ථානයේ අලවනු ලැබුවේ නම් හෝ බලපත්‍රධාරියා විසින් එවැනි යම් ස්ථානයක සේවයෙහි යොදවා සිටින යම් තැනැත්තකුට එය බාර දෙනු ලැබුවේ නම් එය බලපත්‍රධාරියා වෙත බාර දී ඇති සේ සැලකිය යුතු ය.

4–115—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය.-

එල්. ඩී. බී. 74/50

යාපනය මහා නගර සභාව

මහා නගර සභා ආඥාපනත

(252 වන අධිකාරයවූ) මහා නගර සභා ආඥාපනතේ 267 වන සහ 272 වන වගන්ති යටතේ යාපනය මහ නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

බී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975.03.13 දින,
කොළඹ දී ය.

ජලසම්පාදනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

"කොමසාරිස්" යනුවෙන් සභාවේ මහා නගර කොමසාරිස් අදහස් වේ.

"සභාව" යනුවෙන් යාපනය මහා නගර සභාව අදහස් වේ. ජල සම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවහාර කරනු ලබන "ගෘහ කාර්යය" යන්නට විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස අශ්වයින්, ගවයින් හෝ රථවාහන තබා ඇති විට, ඒ අශ්වයින් හෝ ගවයින් සඳහාවූ වතුර, හෝ ඒ අශ්වයින්, ගවයින් හෝ රථවාහන සේදීම සඳහා වතුර, හෝ කිසියම් කර්මාන්තයක්, නිෂ්පාදනයක්, හෝ ව්‍යාපාරයක් සඳහා ජල සැපයීමක් හෝ වතුර මල් සඳහා හෝ පිහිනුම් තටාක සඳහා හෝ සැරසිලි හෝ සැරසිලි කටයුතු සඳහා හෝ යාන්ත්‍රික කටයුතු සඳහා හෝ වාරිමාර්ග කටයුතු සඳහාවූ ජල සැපයීමක් ඇතුළත් නොවේ. තවද "ආඥාපනත" යනුවෙන් (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනත අදහස් වේ.

2. පොදු ජල කණුවලින් හෝ වතුර මල්වලින් හෝ පුද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා තිබෙන වතුර පයිප්පයකින් හෝ මිස, නැතහොත් මේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කර තිබෙන ආකාර යෙන් හැර අන් ලෙසකින් සභාවේ ජල කර්මාන්තයකින් වතුර ලබා නොගත යුතුය.

3. (1) කිසිවකු විසින් කොමසාරිස් ගේ ලිඛිත අවසරය කලින් ලබා ගෙන නැතිනම් අතින් ගෙන යනු ලබන හෝ ගෙනයනු ලැබිය හැකි භාජනයකින් මිස කිසිවකු විසින් පොදු ජල කණුවකින් ජලය ලබා නොගත යුතුය.

(2) කිසිවකු විසින් පොදු ජල කණුවකින් අපතේ යා හැකි අන්දමකට හෝ ප්‍රමාණයකට ජලය ලබා නොගත යුතුය.

4. කිසිවකු විසින් කොයිම පොදු ජල කණුවකටවත් මොනම 'හෝස්' පයිප්පයක්, නළයක්, බටයක්, පිල්ලක් හෝ මොනයම් ස්වභාවයක වුවද අන් කිසි උපකරණයක්, තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් සවි නොකළ යුතුය.

5. කොයිම පොදු ජල කණුවකට වත් සවිකර ඇති හෝ එහි කොටසක්ව පවතින ස්වයංකාරී (ඉබේ ක්‍රියා කරන) ඉපියාව හෝ වෙනත් ස්වයංකාරී උපකරණයක් අතපත ගෑම හෝ ඒ ඉපියාවේ හෝ උපකරණයේ ස්වයංක්‍රියාකාරීත්වය තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් වළක්වන අන්දමේ ක්‍රියාවක් කිසිවකු විසින් නොකළ යුතුය.

6. කිසිවකු විසින් ගෘහ කාර්යයකට හැර වෙන මොනම කටයුත්තකට වත් පොදු ජල කණුවකින් වතුර නොගත යුතුය.

7. ස්පර්ශයෙන් බෝවෙන යම් රෝගයකින් හෝ යම් බෝවෙන රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු විසින් හෝ එබඳු රෝගයකින් පෙළුණු කෙනෙකුට සාත්තු කිරීමෙහි මෑතකදී යෙදී සිටි කිසිවකු විසින් පොදු ජල කණුවකින් වතුර නොගත යුතුය.

8. සභාවට අයිති, හෝ තත් කාලය සඳහා සභාව වෙත පවරනු ලැබූ හෝ සභාව විසින් නඩත්තු කරනු ලබන යම්කිසි ජලාශයකින්, ජල කණුවකින්, වතුර මලකින්, ජල භාජනයකින්, පයිප්පයකින් හෝ වෙන ජල කර්මාන්තයකින් හෝ ඒ අසළ නෑම හෝ තමාගේ ශරීරයේ කොටසක් සේදීම හෝ යම් සතකු නෑවීම හෝ යම් වාහනයක්, ඇඳුම්, භාජන හෝ වෙන කිසිම භාණ්ඩයක් සේදීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

පුද්ගලික ජල සේවයට අදාල නියමයන්

9. කිසිවකු විසින්—

(අ) මීට යා කොට ඇති උපලේඛනයේ 'අ' ආකෘතිය අනුව කොමසාරිස් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ, ඒ සඳහා කොමසාරිස්ගේ ලිඛිත අවසරය කලින් ලබා ගෙන තිබේ නම් මිස,

(ආ) කොමසාරිස්ගේ හෝ කොමසාරිස් විසින් යම් ඉදිකිරීම්, ශුද්ධ පවිත්‍ර කිරීම් හෝ අළුත් කිරීම් වලට අදාළව ඒ සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ යම් තැනැත්තකුගේ හෝ ලිඛිත උපදෙස්වලට අනුව මිස, සහ

(ඇ) එකී ඉදිකිරීම්, ශුද්ධ පවිත්‍ර කිරීම් හෝ අළුත් කිරීම් සඳහා පාවිච්චි කිරීමට නියමිත කොටස් හා උපකරණ කොමසාරිස් විසින් අනුමත කර තිබේ නම් මිස, අළුතෙන් පෞද්ගලික ජල සේවයක් සෑදීම හෝ තිබෙන ජල සේවා පයිප්පයක් වෙනස් කිරීම, දීර්ඝ කිරීම, පිරිසිදු කිරීම හෝ අළුතෙන් සවි කිරීම හෝ නොකළ යුතුය.

ජල සම්පාදන යෝජනා ක්‍රමය

10. එකම දේපළක් වශයෙන් සභාව විසින් තක්සේරු කරනු ලබන්නාවූද, එකම භූමි භාගය ඇතුළත පිහිටියාවූද, යම් ස්ථානය කට ජලය සැපයීම සඳහා එක සේවා නළයකට වැඩි ගණනක් සභාවේ ප්‍රධාන ජල නලයට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ නො කළ යුතු ය.

11. (1) යම් පුද්ගලික ජල සම්පාදන සේවයක් පිහිටුවීම සඳහා පාවිච්චි කරන සියලු පයිප්ප ගල් කීල සංයෝගයක් ආලේප කරන ලද චීනච්චට්ටියෙන්, ගැල්වනයිස් වත් කළ යකඩයෙන්, පොලිතීන් හෝ පොලිවිනිල් ක්ලෝරයිඩ්වලින් සාදා තිබිය යුතුය. ඒ පයිප්ප වල සනකම, තත්ත්වය හා ශක්තිමත් භාවය මෙහි මීට පසු නිශ්චිතව සඳහන් අන්දමට තිබිය යුතු අතර කොමසාරිස් විසින් හෝ කොමසාරිස් විසින් ඒ සඳහා යථා පරිදි බලය දෙනු ලබන යම් නිලධරයකු විසින් හෝ අනුමත කරන ලද ප්‍රකාර විය යුතුය.

(2) යම් පුද්ගලික ජල සම්පාදන සේවාවක් පිහිටුවීම සඳහා පාවිච්චි කරනු ලබන සියලු ගැල්වනයිස් වත් කළ යකඩ පයිප්ප ස්කුරුප්පු මාර්ගයෙන් සන්ධිකොට පීඩනය වර්ග අඟලකට රාත්තල් 200 ක් විය යුතු අතර 1387-1967 බ්‍රිතාන්‍ය තත්ත්වයට අනුකූලව, මධ්‍යම ගණයේ පයිප්ප විය යුතු ය. ඒවායේ බර පහත දැක්වෙන අයුරු විය යුතුය :—

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 3/8 දිග අඩි 100 ට රාත්තල් 64 යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1/2 දිග අඩි 100 ට රාත්තල් 88 යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 3/4 දිග අඩි 100 ට රාත්තල් 125 යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1 යි දිග අඩි 100 ට රාත්තල් 181 යි

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1, 1/4 දිග අඩි 100 ට රාත්තල් 256 යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 1, 1/2 දිග අඩි 100 ට රාත්තල් 320 යි.

ඇතුල් පැත්තේ විෂ්කම්භය අඟල් 2 යි දිග අඩි 100 ට රාත්තල් 405 යි.

(3) යම් කිසි පුද්ගලික ජල සම්පාදන සේවාවක් පිහිටුවීම සඳහා පාවිච්චි කරන සියලු වාත්තු යකඩ පයිප්ප 1211 : 1958 බ්‍රිතාන්‍ය ප්‍රමාණයට අනුකූලව හෝ ටයිටන් පූට්ටුවලට සමාන රබර් පූට්ටුවලින් සන්ධි කළ යුතුය.

(4) යම් කිසි පුද්ගලික ජල සේවයක් සෑදීම සඳහා පාවිච්චි කරන සියලුම 'පොලිතීන්' පයිප්ප 1972 : 1967 බ්‍රිතාන්‍ය තත්ත්වයට අනුකූල විය යුතුය. (ශීත ජල සේලය සඳහා අඩු ඝනත්වය සහිත පොලිතීන් ටියුබක් සඳහා) අංශක 100 උෂ්ණත්වයක දී අඩි 150 ක අඩුම ක්‍රියාත්මක පීඩනයක් සඳහා සුදුසු විය යුතු ය. අවම ඝනත්වය පහත සඳහන් පරිදි විය යුතු ය.

| නාම මාත්‍ර බෝරය අඟල්වලින් | | අවම භිත්ති ඝනත්වය මිමී | | අඟල් |
|---|---|---|---|---|
| 3/8" | ... | ... 2.2 | ... | (0.087) |
| 1/2" | ... | ... 2.7 | ... | (0.106) |
| 3/4" | ... | ... 2.3 | ... | (0.091) |
| 1" | ... | ... 3.0 | ... | (0.118) |
| 1 1/4" | ... | ... 3.7 | ... | (0.146) |
| 1 1/2" | ... | ... 4.3 | ... | (0.109) |
| 2" | ... | ... 5.3 | ... | (0.209) |

(5) පෞද්ගලික ජල සේවයක් තැනීම සඳහා පාවිච්චි කරන සියලුම පොලිතිනල් ක්ලෝරයිඩ් පයිප්ප 3505 : 1968 බ්‍රිතාන්‍ය තත්ත්වයට හෝ කේ 6742 : 1964 සහ කේ 6741 : 1965 ජපන් කාර්මික තත්ත්වයට හෝ ලංකා ඇයතන තත්ත්වයට අනුකූල විය යුතු අතර, අංශක 100 උෂ්ණත්වයක දී අඩි 150 ක අවම ක්‍රියාත්මක පීඩනයක් සඳහා සුදුසු විය යුතුය. එසේම අවම බිත්ති ඝනත්වය පහත සඳහන් පරිදි විය යුතුයි.

| නාම මාත්‍ර බෝරය අඟල්වලින් | | අවම බිත්ති ඝනත්වය මිමි | | අඟල් |
|---|---|---|---|---|
| 3/8″ | ... ... | 1.5 | ... | (0.059) |
| 1/2″ | ... ... | 1.7 | ... | (0.067) |
| 3/4″ | ... ... | 1.9 | ... | (0.075) |
| 1″ | ... ... | 2.2 | ... | (0.087) |
| 1 1/4 | ... ... | 2.2 | ... | (0.087) |
| 1 1/2″ | ... ... | 2.5 | ... | (0.098) |
| 2″ | ... ... | 2.5 | ... | (0.098) |

12. (අ) සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධිත කිසියම් පෞද්ගලික සේවයක වතුර පයිප්ප අතරේ හෝ පයිප්ප, උපකරණ සහ සවිකිරීම් අතරේ වූ සියලුම ප්‍රවිද්‍ර විදුලි බලයෙන් බන්ධිත විය යුතු ය.

(ආ) පරිවෘත බලපෑමක් ඇති පූර්වු උපකරණ කිසියම් පූර්වුවක් ඇතුළට නොදැමිය යුතුය. නමුත් කොමසාරිස්ගේ මතය අනුව එවැනි උපකරණ පැච්චිච් කිරීම නොවැළැක්විය හැකි නම්, පයිප්ප හෝ සවිකිරීම් හෝ ද්‍රාවට්ටුවෙයි හෝ පූර්වුවල විදුලි බලයෙන් සම්බන්ධ කළ යුතුය යන කොන්දේසිය මත ඒවා පැච්චිච් කිරීමට ඔහු විසින් අවසර දිය හැකිය.

13. සෑම නාන බඳුනක, වැසිකිළි බේසමක හෝ මුව දෝවනා බේසමක ආය මුඛය දැහැදිළිව අප මුඛයෙන් වෙන් කොට තැබිය යුතු අතර, ආය මුඛය එකී නාන බඳුනේ, වැසිකිළි බේසමේ හෝ මුව දෝවන බේසමේ මුදුනේ හෝ ඊට ඉහළින් පිහිටා තිබිය යුතු ය.

14. සෑම ජල භාජනයකම අය මුඛය හෝ සැපයීම් පයිප්පය සවිකළ යුත්තේ බෙදීම් මට්ටම එකී ජල භාජනයේ ඉහළම ජල මට්ටමට ඉහළින් සිටිය පරිදි වේ.

15. (1) යම් කිසි පුද්ගලික ජල සේවාවක් පිහිටුවීම, දීර්ඝ කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ වියදම ඉල්ලුම්කරු විසින් දැරිය යුතුය.

(2) පුද්ගලික ජල සේවයන්හි සියලුම පයිප්ප සහ සවි කිරීම් දැමීම හා කිරීම කළ යුත්තේ සභාව විසින් අනුමත කරන ලද නැනැත්තකු විසිනුත්, කොමසාරිස් හෝ කොමසාරිස් විසින් අවසර දෙන ලද නිලධරයකු සෑහීමට පත්වන අයුරුත් ය.

16. යම් කිසි තැනැත්තකු, ඒතැනැත්තා—

(අ) යාපනය මහ නගර සභාව විසින් තමා ජල නල ආදිය අලුත් වැඩියා කරන්නෙකැයි තමා වෙත නිකුත් කරන ලද බල පත්‍රයක් දරන්නේ යයි, හෝ

(අ) ලංකා කාර්මික විද්‍යාලයෙන් නිකුත් කරන ලද ජල නල ආදිය අලුත් වැඩියා කිරීමේ සහතිකයක් දරන්නේයයි, හෝ

(ඇ) පුද්ගලික ජල සේවා පිහිටුවීමේ ව්‍යාපාරයෙහි යෙදෙන තැනැත්තන්ගෙන් යුත් යම් කිසි පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් නම්, ජල සම්පාදන කටයුතු සම්බන්ධව පළපුරුද්දෙන් ලත් අත්දැකීමෙන් යුත් සිවිල් ඉංජිනේරුවකු හෝ (අ) හෝ (ආ) ඡේදයෙහි නියමිත සුදුසුකම් ඇති තැනැත්තකු එකී මණ්ඩලයෙහි සේවයෙහි යෙදී සිටී යයි කොමසාරිස් සෑහීමට පත් කරනු ලැබෙතොත් මිස, 12 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කිසිම තැනැත්තකු ජන නල අලුත් වැඩියා කරන්නකු වශයෙන් අනුමත නො කරනු ලැබිය යුතු ය.

17. සෑම පුද්ගලික ජල සේවයක් සඳහාම, කොමසාරිස් විසින් හෝ ඒ සඳහා ඔහුගේ නියෝජිතයා විසින් අනුමත කරන ලද වගීයෙන් ශක්තිමත් කර ඇණයක් සපයා තිබිය යුතු අතර, එකී කර ඇණය එකී සේවය සපයනු ලබන ස්ථානයට හැකි පමණ කිට්ටුවෙන් සවිකර තිබිය යුතු ය. තවද සියලුම අවස්ථාවලද එකී කර ඇණය වෙත ළඟා විය හැකි වන සේ ඊට පියනක් සහිත වූ කුඩා පෙට්ටියක් සැපයිය යුතු ය.

18. අළුතෙන් සාදන ලද පුද්ගලික ජල සේවයක කොටසක් වන පයිප්ප වැල්ව් හෝ වෙනත් සවි කිරීම්, ඒවා කොමසාරිස් විසින් හෝ ඒ සඳහා කොමසාරිස් විසින් බලය දී ඇති නිලධරයකු විසින් පරීක්ෂා කර බලා ලියවිල්ලක් මගින් අනුමත කොට තිබේ නම් මිස ආවරණය නොකළ යුතු ය.

19. අළුතෙන් සාදන ලද පුද්ගලික ජල සේවයක් 18 වන අතුරු ව්‍යවස්ථාව යටතේ පරීක්ෂා කොට, අනුමත කර ඇති පසු—

(අ) කොමසාරිස් විසින් තක්සේරු කරනු ලබන පරිදි කම්කරු, උපකරණ සහ පරිපාලන වියදම ද ඇතුලුව ජල සේවය සභාවේ ප්‍රධාන ජල නලයට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කිරීමේ වියදම, සහ

(ආ) සම්බන්ධ කිරීම හා ජලය සැපයීම, පිළිබඳව වාර මුදලක් හෝ රු. 50 ක අමතර ගාස්තුවක්, සහ

(ඇ) ගෘහ කටයුතු සම්බන්ධයෙන් රු. 25ක ඇපයක් ද, වාණිජ කටයුතු සම්බන්ධයෙන් රු. 100ක ඇපයක් ද පිළිවෙලින් ඉල්ලුම්කරු විසින් සභාවෙහි තැන්පත් කළ යුතු ය.

20. (1) කිසිම සේවා පයිප්පයක්, ඊට සම්බන්ධ වූ යම් කිසි කසල කාණුවක්, කාණුවක් හෝ කසළ දිය කඩිත්තක්, හෝ ඊට සම්බන්ධ කොට ඇති යම් කාණු කවාටයක් තුළට හෝ ඒ අතරින් හෝ වැටෙන අන්දමට හෝ වැළැක්විය නොහැකිම අවස්ථාවකදී මිස, යම් කිසි පෝර වළක් තුළට හෝ ඒ අතරින් වැටෙන ලෙස නොදැමිය යුතු අතර, එකී පයිප්පය තුවුවමනා අන්දමින් දිරා පත්විය හැකි ලෙස යම් කිසි අපවිත්‍ර පසක් හෝ උපකරණයක් සමග සම්බන්ධව පැවතීමට ඉඩ නො තැබිය යුතු ය.

(2) එබඳු යම් කිසි පයිප්පයක් අපවිත්‍ර පසක් හෝ අන්තරාදායක උපකරණයක් අතරින් දැමීම වැළැක්විය නොහැකි නම්, එකී පයිප්පය පිටින් මළ බැඳීම වළක්වා ලන නළයක් අතරින් හෝ කොමසාරිස් විසින් හෝ ඒ සඳහා කොමසාරිස් විසින් බලය දෙන ලද නිලධරයකු විසින් අනුමත කරන ලද වෙනත් යම් කිසි සුදුසු මාර්ගයකින් ගෙන යනු ලැබීමෙන් එය එකී පස හෝ උපකරණය සමග සම්බන්ධ නොවන ලෙස හොඳින් ආරක්ෂා කළ යුතු ය.

21. අළුතෙන් සාදන ලද කිසිම පුද්ගලික ජල සේවයක් 19 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් මුදල් යථා පරිදි තැන්පත් කරනු ලබන තුරු සභාවේ ප්‍රධාන ජල නලයට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ නොකළ යුතු ය. එකී මුදල් තැන්පත් කළ විට, සභාව විසින් එකී පුද්ගලික ජල සේවයට ජලය සැපයීම කළ යුතු ය.

22. පුද්ගලික ජල සම්පාදන සේවයක් සපයා තිබෙන යම් කිසි පුද්ගලික ස්ථානයකට ජලය සැපයීම, එකී සැපයීම සභාවේ ප්‍රධාන ජල නළයට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කළ අවස්ථාවේ සිට සියලු කටයුතු සඳහා ආරම්භ වී ඇතැයි සැලකිය යුතු ය.

23. අළුතෙන් සාදන ලද පුද්ගලික ජල සේවයක් සභාවේ ප්‍රධාන ජල නළයට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කිරීමෙන් පසුව, ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම මීට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන 'අ' ආකෘති පත්‍රයෙන් කොමසාරිස් විසින් ඉල්ලුම්කරුට දිය යුතු ය. සම්බන්ධ කිරේම් වියදම පියවා ගැනීම පිණිස ඉල්ලුම්කරු විසින් තැන්පත් කරන ලද මුදලින් යම් කිසි ගණනක් වියදම් නොවී ඉතිරි වුවහොත්, එය ඉල්ලුම්කරුට ආපසු දිය යුතුය. ඇත්ත වශයෙන්ම දරන ලද වියදම තක්සේරු කළ වියදමට වඩා වැඩි වුවහොත් එසේ වැඩි වූ ගණන ඉල්ලුම්කරු වෙත දන්වූ විට ඔහු විසින් එය වහාම සභාවේ තැන්පත් කළ යුතු ය. එසේ වැඩි වන ගණන සභාව වෙත නො ගෙවනු ලැබුව හොත් කොමසාරිස් විසින් ඒ ජල සේවය එකී පුද්ගලික සේවයෙන් අසම්බන්ධ කළ යුතු ය.

24. (1) එක් එක් පුද්ගලික සේවයෙහි වූ කර ඇණයක්, ජල මාපක යන්ත්‍රයක්, එකී කර ඇණය හා සභාවේ ප්‍රධාන ජල නළය හා අතර ඇති සේවා නළයේ කොටසක් සභාවේ දේපළ වශයෙන් සැලකිය යුතු අතර, එකී කර ඇණයත්, ජල මාපක යන්ත්‍රයත් සේවා නළයත් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ ඉවත් කිරීම පිළිබඳ වියදම සභාව විසින් දැරිය යුතු ය.

(2) පුද්ගලික ජල සේවයක් සපයා ඇති ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් හිතාමතාම හෝ නොසැලකිලිකමින් (1) වැනි ඡේදයේ සඳහන් කර ඇණයට සහ/හෝ ජල මාපක යන්ත්‍රයට යම් කිසි අලාභ හානියක් සිදු කරවනු ලැබුවහොත් සභාව විසින් තක්සේරු කළ හැකි පරිදි එකී කර ඇණය සහ/හෝ ජල මාපක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ වියදම් එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාවට ගෙවිය යුතුවත් හැර, එකී මුදල එසේ ගෙවනු ලබන තුරු ඒ සේවය අසම්බන්ධ කිරීමට කොමසාරිස්ට බලය තිබිය යුතුය.

25. මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනයට පසුව—

(අ) පුද්ගලික සේවයෙහි සැපයෙන ජලයෙන් යම් කොටසක් තබා ගැනීම සඳහා ගැලුම් 100කට වැඩි ප්‍රමාණයක් අල්ලන වැංකියක්, ජල භාජනයක් හෝ නාන බාල්දියක්, යම් ස්ථානයක සවි කිරීම හෝ තැනීම නොකළ යුතු ය. තවද,

(ආ) පුද්ගලික ජල සේවයකින් සැපයෙන ජලයෙන් යම් කිසි කොටසක් තබා ගැනීම පිණිස කිසිම ජල භාජනයක්, වැංකියක් හෝ නාන බාල්දියක්, එකී ජල භාජනයේ වැංකියේ හෝ නාන බාල්දියේ ප්‍රමාණය සහ සැලැස්ම ද සවි කළ යුතු හෝ සෑදිය යුතු එකී ජලාශ, වැංකි හෝ නාන බාල්දි ගණන ද කොමසාරිස් විසින් කලින් අනුමත කරනු ලැබ තිබේ නම් මිස, සවි කිරීම හෝ සෑදීම නොකළ යුතු ය.

26. සෑම ජල භාජනයකම පිටාර පයිප්පය හොඳතැගිල්ලෙන් පිටතට ගෙන, යම් කාන්දුවීමක් වුවහොත්, පහසුවෙන් සොයා ගත හැකි වන පරිදි ප්‍රකට ස්ථානයකින් අවසන් විය යුතු ය. යම් කිසි ජල භාජනයක පිටාර පයිප්පය කිසිම හේතුවක් නිසා යම් කාණුවකට හෝ කසළ කාණුවකට හෝ යම් නාන බඳුනක මුව දෝවනා බේසමක හෝ වෙනත් යම් සෞඛ්‍ය උපකරණයක හෝ වෙනත් යම් ජල භාජනයකග පිටාර පයිප්පයකට සම්බන්ධ නොකළ යුතුය. එක් එක් ජල භාජනයට වෙන් වෙන් වශයෙන් පිටාර පයිප්පයක් තිබිය යුතු ය.

27. යම් ස්ථානයක සේවා පයිප්පය, ජල භාජනය හෝ වෙනත් සේවා සවිකිරීම් වෙන යම් ස්ථානයක යම් සේවා පයිප්පයක්, ජල භාජනයක් හෝ වෙනත් සවි කිරීම් වලට සම්බන්ධ නොකළ යුතු ය.

28. පෞද්ගලික ජල සේවයක කොටසක් වන පයිප්පයක්, කොමසාරිස්ගේ ප්‍රකාශිත අනුමැතිය නොමැතිව, යම් බොයිලේරුවක්, කොන්ඩෙන්සරයක්, හෝ වෙනත් යාන්ත්‍රික උපකරණයක් සමග කෙලින්ම සම්බන්ධ නොකළ යුතුය.

29. (1) සෑම ජල භාජනයකම ඇතුල් පැත්තේ "බෝල් වැල්වයක්" සහ පිට පැත්තේ කර ඇණයක් ද සවි කළ යුතු ය. එකී බෝල් වැල්වය " හැකි සෑම විටම අඟල් දෙකකට වඩා වැඩි නොවන සාමාන්‍ය ප්‍රමාණයක සහ " පෝර්ට්ස්මත් " වර්ගයෙන් ද විය යුතු අතර, එය "බෝල් වැල්ව" සඳහා වූ 1212 : 1953 බ්‍රිතාන්‍ය තත්ත්වයේ එකක් විය යුතු ය.

(2) " බෝල් වැල්වය " පෝර්ට්ස්මත් ' වර්ගයෙන් එකක් නොවන විට, එය හොඳ වර්ගයේ වූත්, සුදුසු අන්දමේ වූත්, එකක් විය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි විය යුතු ය :—

(අ) සෑම අධික පීඩන වැල්වයක් ම වර්ග අඟලකට රාත්තල් 200ක පරීක්‍ෂණ පීඩණයකින් ද සෑම මධ්‍ය පීඩන වැල්වයක්ම වර්ග අඟලකට රාත්තල් 100ක පරීක්‍ෂණ පීඩනයකින් ද සෑම අඩු පීඩන වැල්වයක්ම වර්ග අඟලකට රාත්තල් 40ක පරීක්‍ෂණ පීඩනයකින් ද, වැසිය යුතු අතර ඒ සෑම වැල්වයක් ම මාරුවෙන් මාරුවට පාවිච්චි කළ හැකි විවර අසුනක් සහිත වැල්වයක් නොවන හෙයින්, පිළිවෙලින් " එච්. පී " " එම්. පී. " හෝ " එල්. ඊ " යන අකුරු එහි සවි කිරීම්වල ප්‍රධාන කොටසේ යෙදිය යුතුය. නැතහොත් මුද්‍රා තැබිය යුතුය. තවද, ඒ සෑම වැල්වයක්ම වසා තිබෙන විට, වර්ග අඟලකට රාත්තල් 300 ක් වූ පීඩනයකට ප්‍රතිරෝධය දැක්වීමේ ශක්තියක් එයට තිබිය යුතු ය.

(ආ) පිස්ටන් වර්ගයේ සෑම වැල්වයකටම වෝල්කනයිස් කරන ලද සුදුසු රබරයකින් හෝ එබඳු සුදුසු අන්දමේ වෙනත් ද්‍රව්‍යයකින් සාදන ලද වොෂරයක් සැපයිය යුතු අතර, වැල්වයේ ප්‍රමාණය අඟල් දෙකකට වැඩි නොවන විට වහලයේ පිස්ටනයට ඇතුල් පැත්තේ ඉස්කුරුප්පුවකින් සවි කළ යුතු ය.

(ඇ) අඟල් දෙකකට වැඩි නොවන සාමාන්‍ය ප්‍රමාණයේ සෑම වැල්වයක් සඳහා ම පිස්ටනය සහ කඳ මත මළ නොබැඳෙන ලෝහ මිශ්‍රණයක් තවරා තිබිය යුතු අතර, ලීවරය මත ද එසේම මළ නොබැඳෙන ලෝහ මිශ්‍රණයක් ආලේප කර තිබිය යුතු ය. නැතහොත් එය තඹෙන් සාදා තිබිය යුතු ය. එසේම එය සාමාන්‍ය ක්‍රියාකාර තත්ත්වයට ඔරොත්තු දෙන අන්දමේ සෑහෙන ශක්තිමත් භාවයකින් ද යුක්ත විය යුතුය.

(ඈ) අඟල් දෙකකට වැඩි නොවන සාමාන්‍ය ප්‍රමාණයක සෑම යකඩ ලෝහ වැල්වයකටම එහි ඇතුල් පැත්තේ අරයක් තිබිය යුතු ය. (එය බ්‍රිතාන්‍ය තත්ත්වයේ 10 :1962 ' ඩී ') වක්‍රයට අනුව විය යුතු ය. 1218 : 1946 බ්‍රිතාන්‍ය සම්මුතියට අවශ්‍යතාවයන්ට අනුව ගිල්වා නැතහොත්, 1387 :1967 බ්‍රිතාන්‍ය සම්මුති අවශ්‍යතාවයන්ට අනුව, ගැල්වනයිස් කොට මළ බැඳීමෙන් වලක්වා ගත යුතු ය. තවද එහි ක්‍රියාකාරී මතු පිට සම්පූර්ණයෙන්ම පෝරු දැමිය යුතු ය.

(ඉ) අඟල් දොළහකට වැඩි නොවන සාමාන්‍ය පිටස්තර විෂ්කම්භයක් ඇති සෑම පාවෙන බෝල් වැල්වයක්, එහි පාවෙන කොටස තඹ නම්, එය 1968 :1953 බ්‍රිතාන්‍ය සම්මුති අනුව විය යුතු ය. ප්ලාස්ටික් නම් 2456 : 1954 බ්‍රිතාන්‍ය තත්ත්වය අනුව විය යුතු ය. වෙනත් ද්‍රව්‍යයකින් නම්, පාවෙන කොටස 1212 : 1953 බ්‍රිතාන්‍ය සම්මුති නියමයන් අනුව විය යුතු ය.

(ඊ) සෑම " බෝල් වැල්වයක්ම " ජලාශයකට සවි කළ විට එහි විවරයේ ප්‍රමාණය, පාවෙන බෝලයේ ප්‍රමාණය සහ ලීවරයේ දිග එකිනෙකට කෙසේ ප්‍රමිත කළ යුතු ද යත්, පාවෙන බෝලය එහි ප්‍රමාණයෙන් භාගයකට වඩා වැඩි නොවන ගණනකට ගිලුණ විට, බෝල් වැල්වය ක්‍රියා කිරීමට අවශ්‍ය විය හැකි අධිකතම පීඩනයෙන් ඊට ජලය ඇතුල් නොවන සේ තිබිය යුතුය.

(උ) ගබඩා ජලාසයකට සවි කරන සෑම බෝල වැල්වයක්ම හෝ පාවෙන බෝලය ක්‍රියා කරන වැල්වයක්ම ජල මට්ටම ට ඉහළින් සිටින පරිදි ආරක්‍ෂා සහිත වූත්, ශක්තිමත් ලෙසත්, සවි කළ යුතු අතර, එය ඇතුල් පයිප්පයෙන් වෙනස් වන සේ වැල්වයේ කිසිම කොටසක් ජලාශය පිටාරේ ගලා යන මට්ටම ට ඇරතැබූ විට කිඳා නො බසින සේ පිහිටු විය යුතු ය.

(ඌ) බෝල් වැල්වයකට හෝ පාවෙන බෝලය ක්‍රියා කරන වැල්වයකට ජලාසය පිටාරේ ගලන මට්ටමට පහළින් ඊට ජලය යවන සේ සවිකර ඇති පයිප්පයක් සපයා තිබෙන විට, වැල්වය අතරින් ජලය ආපසු යාම වැලැක්වීම පිණිස සෑහෙන ප්‍රමාණයේ පිටාර සිදුරක් එකී මට්ටමට ඉහළින් වැල්වයේ බාහිර ගර්භයෙහි සැපයිය යුතු ය.

30. කිසිම තැනැත්තකු ඇතුල් පැත්තෙන් අර්ධ විෂ්කම්භය අඟලකින් 3/4 කට වැඩි වන කිසිම කරාමයක් මොනම පුද්ගලික ජල සේවයකටවත් සවි නොකළ යුතු ය.

ජල මාපක යන්ත්‍ර

31. නගර සභාවේ ජල කර්මාන්තයකින් යම් කිසි ස්ථානයකට සපයන ජලය මනින සියළු මාපක යන්ත්‍ර නගර සභාව විසින් සපයා සවි කළ යුතුවා පමණක් නොව, නගර සභාව සතු දේපල වශයෙන් ද තිබිය යුතුය.

32. (කම්කරුවන්ට, උපකරණවලට හා පරිපාලනයට ගෙවන වියදම ඇතුළුව) මාපක යන්ත්‍ර සවි කිරීමේ වියදම ජලය සපයනු ලබන ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කලින් ගෙවිය යුතු ය.

33. ජල මාපක යන්ත්‍රයක් මගින් ජලය සපයනු ලබන යම් කිසි ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු ඒ මාපක යන්ත්‍රය නඩත්තු කිරීමේ හෝ අළුත් වැඩියා කිරීමේ වියදම ගෙවීමට යටත් නොවිය යුතු ය.

එසේකුදු වුවත්, ඒ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඕනෑකමින් ම කළ දෙයකින් හෝ ඔහුගේ නොසැලකිල්ලෙන් සිදු වූ අලාභ හානියක් නිසා ජල මාපක යන්ත්‍රය අළුත්වැඩියා කිරීම හෝ අළුත් කිරීම අවශ්‍ය වුවහොත්, ඒ අළුත්වැඩියා කිරීමේ හෝ අළුත් කිරීමේ වියදම කොමසාරිස්ගේ ඉල්ලීම පිටත්, කොමසාරිස් විසින් තක්සේරු කරනු ලබන පරිදිත් අයිතිකරු හෝ පදිංචිකරු විසින් නගර සභාවට ගෙවිය යුතු ය.

34. (1) ජල මාපක යන්ත්‍රයක් මගින් ජලය සපයනු ලබන යම් කිසි ස්ථානයක අයිතිකරු විසින් එකී මාපක යන්ත්‍රය පාවිච්චි කිරීම වෙනුවෙන් පහත දැක්වෙන ප්‍රමාණයක් අනුව ගණන් බලන ලද කුලියක් කාර්තුවකට (තුන් මාසයකට) වරක් බැගින් නගර සභාවට කලින් ගෙවිය යුතු ය. නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් 10 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 125 | 0 |
| අඟල් 8 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 110 | 0 |
| අඟල් 6 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 90 | 0 |
| අඟල් 4 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 70 | 0 |
| අඟල් 3 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 45 | 0 |
| අඟල් 2 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 25 | 0 |
| අඟල් 11/2 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 18 | 0 |
| අඟල් 1 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 10 | 0 |
| අඟල් 3/4 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 8 | 0 |
| අඟල් 1/2 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 7 | 0 |
| අඟල් 3/8 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් කාර්තුවකට හෝ ඉන් කොටසකට ... ... ... | 6 | 0 |

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්‍ය සඳහා " කාර්තුවක් " යන්නෙන් එක් එක් අවුරුද්දේ ජනවාරි මස 1 වැනි දින, අප්‍රේල් මස 1 වැනි දින, ජූලි මස 1 වැනි දින හා ඔක්තෝබර් මස 1 වැනි දින ආරම්භ වන්නාවූ පිට පිටම තුන් මාසයක කාල පරිච්ඡේදයක් අදහස් වේ.

35. (1) යම් කිසි කාර්තුවක දී පාවිච්චි කරන ජලයේ ප්‍රමාණය ගණන් ගත යුත්තේ ඒ කාර්තුව ආරම්භයේ දී මාපක යන්ත්‍රයේ සඳහන් ව තිබුණු ගණන හා ඒ කාර්තුව අවසානයේ දී සඳහන්ව තිබුණු ගණන හා අතර වූ වෙනස කොපමණ දැයි පහත පෙනෙන ආකාරයට ගණන් බැලීමෙනි.

(2) අළුතෙන් සවි කරන ලද ජල මාපක යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම්, එය සවි කරන විට සඳහන්ව තිබූ ගණන් ද, වෙන ජල මාපක යන්ත්‍රයක් සම්බන්ධයෙන් නම්, ඊට පෙරාතුවම වූ කාර්තුව වෙනුවෙන් අන්තිමට සඳහන් ව තිබුණු ගණන ද පළමුවෙනි ගණන් ගැනීම වශයෙන් සැලකිය යුතු ය. යම් කාර්තුවක් සඳහා අන්තිමට සඳහන් ගණන විය යුත්තේ ඒ කාර්තුව ඉකුත් වීමට දහ දවසකට මත්තෙන් වූ දිනයක දී හෝ ඒ කාර්තුව ඉකුත් වී දහ දවසකට මත්තෙන් වූ දිනයක දී කෙරෙන ගණන් ගැනීමය.

එසේකුදු වුවත්, අළුත් වැඩියා කිරීම පිණිස ජල මාපක යන්ත්‍රය ඉවත් කිරීම නිසා පූර්වෝක්ත කාල පරිච්ඡේදය ඇතුළත අවසාන ගණන් ගැනීම කිරීමට පිළිවෙලක් නැති කල්හි ජල මාපක යන්ත්‍රය ඉවත් කිරීම ට පෙර අවසන් ගණන් ගැනීම කළ යුතු ය.

(3) යම් කිසි කාර්තුවක දී යම් ස්ථානයක ජල මාපක යන්ත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් පාවිච්චි කර තිබේ නම්, ඒ කාර්තුවේ දී ප්‍රයෝජනයට ගන්නා ජලය ඒ ජල මාපක යන්ත්‍රවල සඳහන් වන ගණන්වල එකතුව විය යුතු ය.

36. (1) ජල මාපක යන්ත්‍රයක් නරක් වූ හෝ අළුත්වැඩියා කිරීම පිණිස හෝ ෂමනය් කොට හරි ගැස්සීම පිණිස ඉවත් කරන හෝ අළුත් ජල මාපක යන්ත්‍රයක් සවි කරන හෝ පරණ මාපක යන්ත්‍රයක් නැවත සවි කරන කවර අවස්ථාවක දී වුවද ඒ බව දැක්වෙන සන්දේශයක් එක ජල මාපක යන්ත්‍රය මගින් ජලය සපයනු ලබන ස්ථානයෙහි තැබිය යුතුය.

(2) ජල මාපක යන්ත්‍රය නරක් වූ විට හෝ අළුත්වැඩියා කිරීම පිණිස හෝ වෙන යම් කරුණක් නිසා ඒ ස්ථානයෙන් ඉවතට ගෙන යන විට, 35 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන නො සලකා, ඒ ජල මාපක යන්ත්‍රය නරක් වී තිබුණු කාල පරිච්ඡේදයේ දී හෝ ජල මාපක යන්ත්‍රයක් නැතිව සේවය ලැබුණු කාල පරිච්ඡේදයේ දී පාවිච්චි කළ ජලය ගණන් බැලිය යුත්තේ, ඒ කාල පරිච්ඡේදයට පෙරාතුවම වූ කාර්තුවේ දී දිනපතා පාවිච්චි කරන ලද ජලයේ සමාන්‍ය ගණන අනුවය.

37. (1) තමාගේ ස්ථානයෙහි වූ ජල මාපක යන්ත්‍රයේ නිවැරදි බව ගැන යම්කිසි පදිංචි කරුවකුට සැකයක් ඇති වුවහොත්, පරීක්ෂණ ගාස්තු වශයෙන් පදිංචිකරු රුපියල් විස්සක් කලින් ගෙවා ඒ යන්ත්‍රයේ නිරවද්‍යතාවය පරීක්ෂා කරවන ලෙස කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටින කල කොමසාරිස් විසින් එකී පදිංචිකරු හෝ ඒ පදිංචිකරු විසින් බලය පවරන ලද යම් කෙනෙකු ඉදිරියේ ඒ ජල මාපක යන්ත්‍රය පරීක්ෂා කර විය යුතු ය. ඒ පරීක්ෂණයෙන් ප්‍රකාශ වන දෙය පිළිගැනීමට කොමසාරිස් ද පදිංචිකරු ද බැඳී සිටිය යුතු ය.

එසේම 34 (2) වැනි අතුරු ව්‍යවස්ථාවේ විස්තර කැරෙන පරිදි, ඒ කාර්තුව වෙනුවෙන් ජල මාපක යන්ත්‍රයෙහි සඳහන් ව තිබුණු ජලයේ ප්‍රමාණය පරීක්ෂයේ ප්‍රතිඵල අනුව හරි ගැස්විය යුතුය.

(2) ජල මාපක යන්ත්‍රයෙහි සඳහන් ව ඇති ගණන නිවැරදි නම්, නැතහොත් ඒ ගණන හා නියම වශයෙන් ලැබුනු ජලය හා අතර ඇති වෙනස නියම වශයෙන් ලැබුණු ජලයේ ප්‍රමාණයෙන් සියයට දෙකකට වැඩි නොවෙතොත්, (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව සභාව විසින් තබා ගත යුතු ය.

(3) ජල මාපක යන්ත්‍රයෙහි සඳහන් ව ඇති ගණන හා නියම වශයෙන් ලැබුණු ජලය හා අතර ඇති වෙනස නියම වශයෙන් ලැබුණු ජලයෙන් සියයට දෙකකට වඩා වැඩි වූ විට, (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවූ පරීක්ෂණ ගාස්තුව පදිංචිකරුට ආපසු ගෙවිය යුතු ය.

38. (1) ජල මාපක යන්ත්‍රවල සඳහන් ව ඇති ගණන් කොමසාරිස් විසින් නියම කරනු ලබන වකවානුවල දී ගණන් ගත යුතු ය. එහෙත් ඒ ගණන් ගැනීම කාර්තුවක දී තුන් වාරයකට වඩා අඩු නො විය යුතු ය.

(2) ජල මාපක යන්ත්‍රයක සඳහන්ව ඇති ගණන, ගණන් ගනු ලබන කවර අවස්ථාවක දී වුවද, ඒ ගණන ඇතුළත් කොට සන්දේශයක් ඒ යන්ත්‍රය මගින් ජලය සැපයෙන ස්ථානයේ " පදිංචිකරුගේ " නමට ලියා තැබිය යුතුය.

ජලය සැපයීම වෙනුවෙන් අය කරන ගාස්තු

39. (1) ගෘහ කාර්යයන් සඳහා ජලය සැපයීම නගර සභාවේ අභිමතය පරිදි මාපක යන්ත්‍රයක් මගින් හෝ වෙන ආකාරයකින් කළ හැකිය. ඒ සඳහා අය කරන ගාස්තු නගර සභාවේ යෝජනාවකින් වරින්වර නියම කරන ප්‍රමාණයන් අනුව විය යුතු ය.

(2) ගෘහ කාර්යයන් හැර වෙනත් කටයුතු සඳහා සභාව විසින් ජලය සපයනු ලබන විට, එසේ ජලය සැපයිය යුත්තේ ජල මාපක යන්ත්‍රය මගිනි. එසේ වුවත්, යම් අවශ්‍ය අවස්ථාවක දී සභාවේ කැමැත්ත පරිදි ජලමාපක යන්ත්‍රයක් මගින් නොව වෙනත් අයුරකින් වුවද, ජලය සැපයීම සභාවට කළ හැකිය.

(3) නගර සභාවේ ජල කර්මාන්තයෙන් ජලය සපයනු ලබන ඕනෑම ස්ථානයක ජල මාපක යන්ත්‍රයක් නගර සභාව විසින් ඕනෑම වේලාවක දී සවි කළ හැකිය.

40. (1) ගෘහ කාර්යයන් සඳහා නොව වෙනත් කාර්යයන් සඳහා ජල මාපක යන්ත්‍රයෙන් සැපයෙන ජලය සඳහා ගාස්තු අය කිරීම සභාවේ යෝජනා සම්මතයකින් වරින් වර නියම කරනු ලබන ප්‍රමාණයන් අනුව විය යුතු ය.

(2) ගෘහ කාර්යයන්ගෙන් බාහිර වූ වෙනත් කටයුතු සඳහා ජල මාපක යන්ත්‍රයක් මගින් නොව වෙනත් ආකාරයකින් ජලය සපයනු ලබන විට, එක් එක් පුද්ගලික ජල සේවය වෙනුවෙන් මාස් පතා නගර සභාවට කලින් ගෙවිය යුතු ගාස්තු සභාවේ යෝජනාවකින් වරින් වර නියම කරන ප්‍රමාණයන්ට අනුකූල විය යුතු ය.

41. (1) ජල මාපක යන්ත්‍රයෙන් හැර පෞද්ගලික සේවයකින් ලබා ගන්නා ලද ජලය සැපයීම ලබන තැනැත්තා විසින් මෙහි ඇති උපලේඛනයෙහි දක්වා තිබෙන සී-1 ආකෘති පත්‍රයේ ගිවිසුමකට ඇතුලත් වී නැත්නම් පාවිච්චි නො කළ යුතු ය.

(2) ජල මාපක යන්ත්‍රය මගින් පෞද්ගලික සේවයෙන් ලබා ගන්නා ලද ජලය සැපයීම ලබන තැනැත්තා විසින් මෙහි ඇති උපලේඛනයේ දක්වා තිබෙන ඇ-2 ආකෘති පත්‍රයේ ගිවිසුමකට ඇතුළත් වී නැත්නම් පාවිච්චි නො කළ යුතු ය.

42. යම් පුද්ගලික ස්ථානයකට සපයනු ලබන ජලය වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව, මීට සංකොට ඇති උප ලේඛනයෙහි ඇති "ඈ" ආකෘතියේ ප්‍රකාර ගණන් බිලව ලියා එවූ විට, ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ ලිපියෙහි සඳහන් දින සිට පහළොස් දවසක් ඇතුලත දී කොමසාරිස්ට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකුට ගෙවිය යුතු ය. එකී ගාස්තුව නියමිත දිනයේ දී හෝ ඊට කලින් ගෙවනු නොලැබුමහොත් ඒ ස්ථානයට ජලය සැපයීම කොමසාරිස් විසින් නතර කල හැකි ය.

ජලය අපතේ යැවීමත් අපවිත්‍ර කිරීමත් වැළැක්වීම

43. කිසිම තැනැත්තකු විසින් නගර සභාවට අයිති යම් ජලාශයක, දිය උල්පතක, ටැංකියක, ජල කණුවක පයිප්පයක හෝ වෙනත් ජල කර්මාන්තයක ජලය මොනම අන්දමකින් වත් අපවිත්‍ර කරනු ලැබීමට, අපිරිසිදු කරනු ලැබීමට හෝ අඩු කරනු ලැබීමට නොසැලැස් විය යුතුවත් හැර, එබඳු කර්මාන්තයකට මොනම ලෙසකින් වත් අලාභහානියක් කිරීම හෝ දනපත ගෑම ද, නො කළ යුතු ය.

44. සභාව විසින් ජලය සපයනු ලබන ඕනෑම ගොඩනැගිල්ලක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත පැය එකකට වඩා අඩු නොවන දන්වීමක් දීමෙන් පසු, පෙරවරු අටටත්, පස්වරු පහටත් අතර තුළ වූ ඕනෑම වේලාවක දී, එකී ගොඩනැගිල්ලට හෝ ස්ථානයකට ඇතුළු වී, එහි ඇති පයිප්ප. ජල කර්මාන්ත වැඩ සහ ඊට සවි කර ඇති උපකරණ ආදියේ තත්ත්වය ගැන පරීක්ෂා කර බැලීමත් එහි ජලය යම් කිසි අන්දමකින් අපතේ යවනු ලැබේද නැතහොත්, අයථා අන්දමින් පාවිච්චි කරණු ලැබේද යනු සොයා බැලීමත් කොමසාරිස් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලබන වෙනත් යම් කිසිවකු විසින් කළ හැකිය. කොමසාරිස්ට හෝ ඔහු විසින් ඒ සඳහා බලය දී ඇති වෙන යම් තැනැත්තකුට, එකී ගොඩනැගිල්ලට හෝ ස්ථානයට එකී වේලාවලදී ඇතුළුවීම යම් කිසි සැහෙන හේතු නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ වලක්වනු ලැබුවහොත්, එකී ස්ථානයට ජලය සැපයීම කොමසාරිස් විසින් නතර කළ හැකි ය.

45. (1) ජල සේවයට සම්බන්ධව ඇති ඕනෑම පුද්ගලික ජල සේවයක කොටසක් වශයෙන් පවතින්නා වූ ද, යම් පයිප්පයක, කරාමයක, වැල්වයක, මීටරයක හෝ වෙනත් උපකරණයක පිළිවෙල, ප්‍රමාණය පිහිටීම, ස්වභාවය හෝ තත්ත්වය නිසා, නගර සභාවේ ජල කර්මාන්තයෙන් සපයනු ලබන ජලය අපතේ යාම හෝ වැරදි ලෙස පාවිච්චි වීම අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම හෝ අපිරිසිදු වීම සිදුවිය හැකි යයි හෝ නගර සභාවේ ජල කර්මාන්තයෙන් ජලය සැපයීම නිසි ලෙස පාලනය කිරීමට හෝ ජලය නිසි ලෙස බෙදා හැරීමට බාධාවක් විය හැකි යයි විශ්වාස කිරීමට කරුණු ඇති වූ කවර අවස්ථාවකදී වුවත්, කොමසාරිස් විසින් ඒ ස්ථානයේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත මීට යාකොට ඇති උපලේඛනයෙහි දක්වෙන "ඉ" ආකෘතිය ප්‍රකාර දන්වීමක්, යැවීමෙන්, එකී දන්වීමේ සඳහන් යම් යම් වෙනස් කිරීම් කරන ලෙස ඔහුට නියම කළ හැකිවාත් හැර, එකී අයිතිකරු පදිංචිකරු විසින්, එකී වෙනස් කිරීම් කොමසාරිස් සෑහීමට පත්වන පරිද්දෙන් එකී දන්වීමේ සඳහන් කාල සීමාව ඇතුලත කරනු නොලැබුවහොත්, එකී ජල සේවය නගර සභාවේ ජල කර්මාන්තයෙන් වහාම අසම්බන්ධ කිරීම කොමසාරිස් විසින් කළ හැකි ය.

(2) අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ නම හෝ පදිංචි ස්ථානය නොදන්නා අවස්ථාවලදී, (1) වැනි ඡේදයේ සඳහන් දන්වීම ඊට සම්බන්ධ ස්ථානයෙහි කාටත් පෙනෙන තැනෙක ඇලවූ කල එය අයිතිකරු හෝ පදිංචිකරු වෙත යථා පරිදි භාර දෙන ලදැයි සැලකිය යුතුය.

46. නගර සභාවේ ජල කර්මාන්තයෙන් පුද්ගලික ජල සේවයක් සපයා තිබෙන යම් ස්ථානයක පදිංචිකරු හෝ අයිතිකරු විසින් එකී සේවයේ කොටසක් වශයෙන් ඇති යම් කරාමයකින්, පයිප්පයකින් මාපක යන්ත්‍රයකින් හෝ වෙනත් සවි කිරීමකින් ජලය අපතේ යන කවර අවස්ථාවකදී වුවද; ඒ බැව් වහාම කොමසාරිස් වෙත දැනුම්දිය යුතු ය.

47. පුද්ගලික ජල සම්පාදන සේවයෙහි කොටසක් වශයෙන් ඇති යම් කරාමයකින්, පයිප්පයකින්, මාපක යන්ත්‍රයකින් හෝ වෙනත් සවි කිරීමකින් ජලය අපතේ යන කවර විටෙක දී වුවද කොමසාරිස් විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලබන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එකී සේවය නගර සභාවේ ජල සේවයෙන් වහාම අසම්බන්ධ කළ හැකි අතර, ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ජලය අපතේ යාමේ හේතුව ඉන් ඉවත් කරන තුරු එකී සේවය නැවත සම්බන්ධ නොකළ යුතු ය.

48. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අසම්බන්ධ කරන ලද යම් පුද්ගලික ජල සේවයක් නැවත සම්බන්ධ කිරීමේ වියදම, එකී සේවය සපයා ඇති ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් දැරිය යුතු ය.

### පොලෝ බද විදුලි කම්බි

49. (1) වොල්ට් 500ක හෝ ඊට වැඩි පීඩනයක් ඇති විද්‍යුත් ධාරාවකට සම්බන්ධ යම් පරිවර්තකයක හෝ වෙනත් විදුලි උපකරණයක පෙට්ටියකින් නගර සභාවේ ජල කර්මාන්තයේ පයිප්පයකට හෝ උපකරණයකට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කරන ලද යම් පුද්ගලික ජල සම්පාදන සේවයකට යම් පොළෝ බද විදුලි කම්බි සවි කිරීමක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් කළ යම් පරිවර්තකයක හෝ වෙනත් විදුලි උපකරණයක පොළෝ තහඩුව හෝ පොළෝ බද විදුලි කම්බියේ යම් කොටසක් නගර සභාවේ ජල කර්මාන්තයේ හෝ නගර සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධිත යම් පෞද්ගලික සේවයක හෝ කොටසක් වන යම් පයිප්පයකින් හෝ උපකරණයකින් යටත් පිරිසෙයින් අඩි දෙකක්වත් ඈතින් තැබිය යුතුය.

50. විදුලි ආලෝක ක්‍රමයෙන් විදුලිය බලය සපයන ගුවන් විදුලි යන්ත්‍රයකට යම් පොළෝ බද විදුලි කම්බියක් සම්බන්ධ කිරීම අවශ්‍ය වූ විට ඒ සම්බන්ධ කිරීම කළ යුත්තේ නගර සභාවේ ජල කර්මාන්තයේ පයිප්පයකින් හෝ උපකරණයකින් හෝ නගර සභාවේ ජල කර්මාන්තයන්ට සම්බන්ධ කර තිබෙන පුද්ගලික ජල සම්පාදන සේවකයකින් අඩි දෙකකට නොඅඩු දුරක සවි කරන පොළෝ තහඩුවක් මගිනි.

51. නගර සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ කර ඇති ජල මාපක යන්ත්‍රයක් පිහිටුවා තිබෙන යම් ස්ථානයක පොළෝ බද යම් විදුලි කම්බියක් සවි කරන යම් තැනැත්තකු විසින් ඒ ජල මාපක යන්ත්‍රයට වතුර එන පැත්තෙහි එකී සවි කිරීම කළ යුතු ය. නැතහොත් ඒ ජල මාපක යන්ත්‍රය හරහට විදුලි කම්බියක් දැමිය යුතුය.

### සාමාන්‍ය

52. (අ) ජල කර්මාන්තයෙන් සැපයෙන ජලය ප්‍රමාණවත් නොවේ යයි හෝ,

(ආ) ප්‍රධාන ජල නළය හෝ ජල කර්මාන්තය විශාල කිරීම, වෙනස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා නැතහොත් ප්‍රධාන වතුර පයිප්ප වලට සේවා පයිප්ප සම්බන්ධ කිරීම සඳහා ඒ කටයුතු කිරීම අවස්ථානුකූලයයි හෝ අවශ්‍යයයි හෝ,

(ඇ) පොදු ජල කණුවකට යම් අලාභ හානියක් සිදුවී ඇති හෙයින් හෝ එහි ජලය අපවිත්‍ර වන හෙයින් හෝ අපතේ යන හෙයින්, යම් යම් කටයුතු කිරීම අවස්ථානුකූල යයි හෝ අවශ්‍යයයි හෝ,

(ඈ) ගින්නක් හට ගැනීමෙන් ජල කර්මාන්තයට යම් අලාභහානියක් සිදුවනු ඇතැයි හෝ සිදුවීමට ඉඩ ඇතැයි හෝ,

කොමසාරිස් සෑහීමට පත්වන කවර විටකදී වුවත් ආඥාපනත යටතේ හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභාවට අය විය යුතු යම් වතුර බද්දක්, ජල මාපක යන්ත්‍ර බද්දක්, හෝ වෙන මුදලක් සම්බන්ධයෙන් කිසිම පාඩුවක් විඳීමට යටත් නොවන පරිදි, නගර සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන නළයකින් සේවා පයිප්පයකින්, පොදු ජල උල්පතකින් හෝ වෙන උපකරණයකින් ජලය සැපයීම අඩුකිරීම, නොකර හැරීම, තාවකාලිකව නතර කිරීම නැවැත්වීම හෝ වෙන අතකට හැරවීම කොමසාරිස් විසින් කළ හැකිය.

53. 18 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් පෞද්ගලික සේවා පයිප්පයක් හෝ සවි කිරීමක් අනුමත කිරීමෙන් හෝ එම සේවා පයිප්පය දමා ඇති ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් ව්‍යවස්ථාවක් යටතේ යම් අවසරයක් හෝ සහතිකයක් දීමෙන්, පයිප්පයේ යම් කොටසක් පිපිරීම නිසා හෝ පයිප්පයේ සවිකිරීම්වල යම් කොටසකින් ජලය ගලා යාම නිසා නොසැලකිය යුතුය.

54. කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක්, හෝ වෙනත් ක්‍රමයක් යටතේ වුවද, ජලය සැපයීමට සභාව අපොහොසත් වුවහොත් එසේ අපොහොසත් වන්නේ අසාමාන්‍ය නියඟයක්, යම් කර්මාන්තයක් කරගෙන යෑමේ දී ඇති විය හැකි තාවකාලික බාධකයක් හෝ වෙනත් නොවැළැක්විය හැකි කාරණයක් හෝ හදිසියක් හේතු කොට ගෙන නම්, අලාභය සඳහා වන්දි ගෙවීමට සභාව යටත් නොවිය යුතුය.

55. යම් ස්ථානයක ජලය සැපයීම කපා හැරීමට හෝ නතර කිරීමට මේ අතුරු ව්‍යවස්ථා වලින් සභාවට බලය දෙනු ලබන සියළුම අවස්ථා සම්බන්ධයෙන්, සභාව විසින් ඒ සඳහා අවසර දෙනු ලබන යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත පැය හයකට කලින් දැනුම් දීමෙන් පසුව, ඔහුගේ කම්කරුවන් ද සමග පෙරවරු අටටත් පස්වරු පහටත් අතර කාල සීමාව ඇතුළත එකී ස්ථානයට ඇතුළුවී එහි ජලය සැපයීම කපා හැර, සභාවේ දේපළ වන යම් යම් පයිප්ප, මාපක යන්ත්‍ර හෝ සවි කිරීම් ඉවත් කළ හැකිය.

56. (1) යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා නගර සභාවේ ජල කර්මාන්තයෙන් තාවකාලික සම්බන්ධ කිරීමක් මගින් යම් ස්ථානයකට ජලය සපයනු ලබන විට, එකී ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි ඉදිකළ පසු එකී ජල සේවය අසම්බන්ධ කළ යුතුය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් කාර්යය සම්බන්ධයෙන් සපයන ලද ජලය සඳහා වූ ගාස්තුව, 39 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගෘහ කාර්යයන්ගෙන් බාහිර වූ වෙනත් කටයුතු සඳහා නියමිත ප්‍රමාණයන්ට අනුකූල විය යුතුය.

57. මේ අතුරු ව්‍යවස්ථා යටතේ නගර සභාවට ගෙවිය යුතු සියලු මුදල් කොමසාරිස් වෙත හෝ කොමසාරිස් විසින් ඒ සඳහා ලිය විල්ලකින් බලය පවරන ලද නිලධරයකු වෙත ගෙවිය යුතුය.

58. මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් කිසිවක් උල්ලංඝනය කරන හැම අවස්ථාවකදීම රුපියල් පණහකට වැඩි නොවන දඩයක් ගැසීමෙන්ද, එකී උල්ලංඝනය කිරීම ගැන වරදකරු බව ඔප්පු වූ පසු හෝ, එකී උල්ලංඝනය කිරීම ගැන සිතිපත් කරවා කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලදරයකු විසින් දැන්වීමක් භාර දුන් පසු, එකී උල්ලංඝනය කිරීම දිගින් දිගටම කර ගෙන ගියහොත්, එසේ එකී උල්ලංඝනය කිරීම කර ගෙන යන එක් එක් දවසට රුපියල් දහයකට වැඩි නොවන අතිරේක දඩයක් ගැසීමෙන්ද දඬුවම් දිය හැකි විය යුතුය.

### උප ලේඛනය

**"අ" ආකෘති පත්‍රය (9 වැනි අතුරු ව්‍යවස්ථාව)**

යාපනය මහ නගර සභාව

**ජල කර්මාන්ත අංශය**

අංකය ————.

යාපනයේ මහ නගර සභාවේ කොමසාරිස් වෙතටය.

මීට යා කොට ඇති උපලේඛනයෙහි දක්වා ඇති ආකාරයට ———— කොට්ඨාශයේ ———— වීථියේ ———— වැනි අංකය දරණ ගෙට පුද්ගලික ජල සේවය—

*දැමීම,
*වෙනස් කිරීම,
*දීර්ඝ කිරීම,
*ශුද්ධ කිරීම,

සඳහා ඔබේ අනුමැය ලියවිල්ලකින් දෙන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

*කුලී නිවැසියකු පදිංචිව සිටී නම්, වාර්ෂික කුලිය රු. ————.

*අයිතිකරු පදිංචිවී සිටී නම්, වාර්ෂික වටිනාකම රු. ————.

*දැනට තිබෙන සේවයේ ප්‍රමාණය ————.

ජලය වුවමනා කරන්නේ ගෘහ කාර්‍යයන් සඳහා ද නැතහොත් වෙන කටයුතු සඳහා ද යන වග :————.

ස්ථානය පාවිච්චි කරනු ලබන්නේ කුමන කටයුත්තක් සඳහා ද යන වග : ————.

තැන්පත් කළ මුදල රු. ————.

### උප ලේඛනය

| පුද්ගලික ස්ථානයකට පයිප්ප දැමීම | | | කරාම | | ජලාශ | |
|---|---|---|---|---|---|---|
| දිග | ප්‍රමාණය | ගණන | පිහිටීම | ප්‍රමාණය | වතුර අල්ලන ප්‍රමාණය | පිහිටීම |
| | | | | | | |

කිය යුතු කරුණු :————.

පැහැදිලි ලෙස ලියන්න :————.

* අයිතිකරුගේ අත්සන :————.
* අයිතිකරුගේ නම :————.
* අයිතිකරුගේ ලිපිනය :————.
* පදිංචිකරුගේ අත්සන :————.
* පදිංචිකරුගේ නම :————.

* වුවමනා නැති වචන කපා හා දමන්න.

කාර්යාලයේදී සම්පූර්ණ කිරීම පිණිසයි.

අනුමත කරන ලදී.

කොමසාරිස්,
යාපනය මහ නගර සභාව.

මුදල බැර කළ දිනය :————.
ජල කර්මාන්ත අංශයට යැවූ දිනය :————.
වැඩ අවසන් කිරීමෙන් පසු වාර්තාව ලැබුණ දිනය :————.
කරාම පිහිටුවීම දැක්වෙන පරිදි, ස්ථානයෙහි එක-රේඛාගත සැලැස්මක් මෙහි ඇතුළත් කරන්න.

සංලක්ෂ්‍යය.—(1) ජල සේවය සඳහා එවන සියලුම ඉල්ලුම් පත්‍ර "ඒ" අක්ෂරය දරණ නිල ආකෘති පත්‍රයෙහි සැපයිය යුතුය.

(2) ජල සේවය සඳහා එවන සියලුම ඉල්ලුම් පත්‍ර නගර සභාව විසින් අනුමත කළ යුතුයි.

(3) පුද්ගලික ජල සේවයක් පිහිටුවීම සඳහා අවසර දුන් විට ඒ සේවයෙන් ජලය සපයන ස්ථානය නගර සභාවේ ප්‍රධාන වතුර පයිප්පවලට හෝ ප්‍රධාන අතිරේක වතුර පයිප්පවලට සම්බන්ධ කළ යුත්තේ කොමසාරිස් විසින් බලය පවරන ලද නගර සභාවේ නිලධරයකුගේ පරිපාලනය යටතේ ය.

(4) පුද්ගලික ජල සේවයක් වෙනුවෙන් රු. 25 ක ගාස්තුවක් ගෙවිය යුතු ය.

(5) වතුර පයිප්ප හා උපකරණ සවි කිරීම හා දැමීම කළ යුත්තේ කොමසාරිස් විසින් යථා පරිදි බලය පවරන ලද තැනැත්තන් විසින් පමණකි. එසේම කොමසාරිස් විසින් බලය පවරන ලද නගර සභාවේ නිලධරයකු අනුමත කරන තුරු එකී පයිප්ප සහ සවි කිරීම් පාවිච්චි නො කළ යුතු ය.

(6) (අ) ගෘහ කාර්යයන් සඳහා සපයනු ලබන ජලය මාපක යන්ත්‍රය අනුව හෝ වෙනත් අයුරකින් විය යුතු අතර, මාපක යන්ත්‍රයක් සවිකොට නැති කල්හි 39 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

(ආ) ගෘහ කාර්යයන්ගෙන් බාහිරවූ වෙනත් කටයුතු වලට සපයන ජලය වෙනුවෙන් ගාස්තුව අය කළ යුත්තේ ජල මාපක යන්ත්‍රයෙහි සටහන් වන ගණන් අනුවය. ජල මාපක යන්ත්‍ර සවි කර නොමැති විට 40 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ගාස්තු ගෙවිය යුතු ය.

(7) පුද්ගලික ජල සේවයක් පිහිටුවා ඇති ගෙයක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, පදිංචිකරු මාරුවී යාමට ආසන්න වූ කවර විටක දී වුවද, ඒ බව මහා නගර සභාවේ කොමසාරිස්ට යථා කාලයේ දී ම දැන්විය යුතු ය.

(8) තමාගේ ගෙයට හෝ ස්ථානයට සවි කර තිබෙන යම් කරාමයකින් හෝ ජල මාපක යන්ත්‍රයකින් හෝ පයිප්පයකින් හෝ වෙන උපකරණයකින් ජලය අපතේ යන බව දැන ගත් කවර අවස්ථාවක දී වුවද, ඒ බව වහාම නගර සභාවේ කොමසාරිස් වෙත දැනුම් දීම පුද්ගලික ජල සේවයක් පිහිටුවා ඇති ගෙයක හෝ ස්ථානයක සෑම අයිතිකරුගේ හෝ පදිංචි කරුගේ යුතුකම විය යුතු ය.

———————,
ඉල්ලුම්කරු.

"ආ" ආකෘති පත්‍රය

(23 වැනි අතුරු ව්‍යවස්ථාව)

අංකය :————

19..............මස ...... දින,
මහා නගර සභා කාර්යාලයේ දීය.

මහ නගර සභාවේ ඇති ගිණුම

| දිනය | විස්තර | රු. ශ. |
|---|---|---|
| | ———— වීදියේ අංක ———— දරන ස්ථානයෙහි පයිප්ප දැමීම හෝ මාපක යන්ත්‍ර සවිකිරීම සඳහා සපයන ලද ද්‍රව්‍ය වෙනුවෙන් ———— ඉහත සඳහන් ———— සම්බන්ධයෙන් කම්කරුවන් හා පරිපාලනය වෙනුවෙන් ———— ප්‍රධාන ජල නළයෙන් ජලය ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු————.<br><br>මුළු ගණන :————.<br>තැන්පත් කළ මුදල :————.<br>ලැබිය යුතු ශේෂය :———— | |

යාපනය මහ නගර සභාවේ
කොමසාරිස්.

"ඇ" (1) ආකෘති පත්‍රය

**(41 (1) වැනි අතුරු ව්‍යවස්ථාව)**

යාපනය මහ නගර සභාව

පෞද්ගලික සේවය මඟින් ජලය සැපයීම සඳහා————(පිහිටි) ————වැනි වරිපනම් අංකය දරන ස්ථානයෙහි (මින් පසු "අයිතිකරු" යි ව්‍යවහාර වන,) අයිතිකරු වන————එක් පක්ෂයක් වශයෙන් ද, යාපනය මහ නගර සභාව (මින් පසු "සභාව" යයි ව්‍යවහාර වන) අනික් පක්ෂය වශයෙන් ද ඇතුළත් වන ගිවිසුමේ වගයි.

පහත සඳහන් කටයුතු, එනම් :—

(අ) ගෘහ කටයුතු

(ආ) ගෘහ කාර්යයන්ගෙන් බාහිර කටයුතු

සඳහා ඉහත සඳහන් ස්ථානයට ජලය සැපයීම සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට අයිතිකරු මෙයින් එකඟ වෙයි :—

(අ) අඟල්————ක ජල මාපක යන්ත්‍රයකින් ජලය සැපයිය යුතු ය.

(ආ) ජල මාපක යන්ත්‍රයේ බද්ද වශයෙන් අයිතිකරු විසින් 39 වන සහ 40 වන අතුරු ව්‍යවස්ථා යටතේ දක්වා ඇති පරිදි————කට රුපියල් ———— (රු.————) ක මුදලක් නගර සභාවේ කොමසාරිස්ට කලින් ගෙවිය යුතු ය. නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

ජලය වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව නියමිත දිනයේ සිට පහළොස් දවසක් ඇතුළත දී නගර සභාවේ කොමසාරිස් වෙත නොගෙවූ වහොත් ජල සේවය පාවිච්චි කිරීමට ඇති අයිතිවාසිකම සභාව සතු කර ගත යුතුවාත් හැර, ජල සේවය නැවැත්වීම ද නගර සභාව විසින් කළ හැකිය .

ගිවිසුම අවසන් කර ගැනීමට අදහස් කරන බැව් එක් පාර්ශ්වයක් විසින් අනික් පාර්ශ්වයට තිස් දවසකට කලින් දැන්වීමෙන් කිනම් පාර්ශ්වයකට වුවද, එය අවසන් කර ගත හැකි ය. එසේ ගිවිසුම අවසන් කර ගත හොත්, අළුතෙන් ගිවිසුමකට බැඳෙන තුරු ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට ජල සේවය පාවිච්චි කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

පදිංචිකරු වෙනස් වීමට ආසන්න වූ කවර අවස්ථාවක වුවද, ඒ බව අයිතිකරු විසින් කල් ඇතිව දැන්විය යුතු ය. එසේ ම ඉහත සඳහන් කොන්දේසි පිළිගැනීමට කැමති බව ලියවිල්ලකින් දන්වන තුරු ඒ ජල සේවය පාවිච්චි කිරීමට කිසිම පදිංචිකරුවකුට අයිතිවාසිකමක් නො තිබිය යුතු ය. ...

ජල සම්පාදනයට අදාළව සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධි විධාන මෙම ගිවිසුමේම කොටසක් වශයෙන් සැලකිය යුතු ය.

එක් දහස් නවසිය————වූ————මස———— වැනි දින වූ මෙදින————යාපනයේ දී අත්සන් කරන ලදී.

————:
අයිතිකරු.

————,
කොමසාරිස්,
යාපනය මහා නගර සභාව.

අත්සන් සහතික කළ බවට සාක්ෂිකරුවෝ :—

1. ————,
2. ————.

මහ නගර සභාව, යාපනය

"ඇ 1" ආකෘති පත්‍රය (40 (2) වන අතුරු ව්‍යවස්ථාව

ගෘහ කාර්යයන්ගෙන් බාහිර වූ වෙනත් කටයුතු වලට ජල මාපක යන්ත්‍රය ජලය සැපයීම සඳහා ———— පිහිටි ———— වන වරිපනම් අංකය දරන ස්ථානයෙහි (මින්පසු "අයිතිකරු" යි ව්‍යවහාර වන,) අයිතිකරු වන ———— එක් පක්ෂයක් වශයෙන් ද යාපනය මහා නගර සභාව අනික් පක්ෂය වශයෙන් ද ඇතුළත් වන ගිවිසුමේ වගයි.

2. ගෘහ කාර්යයන්ගෙන් බාහිර වූ වෙනත් කටයුතු එනම් :—

(අ) ————,
(ආ) ————,
(ඇ) ————.

සඳහා ඉහත සඳහන් ස්ථානයට ජලය සැපයීමක් ලබාදීම සඳහා මෙහි පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට අයිතිකරු මෙයින් එකඟ වෙයි :—

(අ) අඟල් ———— ක ජල මාපක යන්ත්‍රයකින් ජලය සැපයිය යුතු ය.

(ආ) ජලමාපක යන්ත්‍රයේ බද්ද වශයෙන් අයිතිකරු විසින් කාර්තුවක් වෙනුවෙන් රුපියල් ———— (රු.———— ) ක මුදලක් නගර සභාවේ කොමසාරිස්ට කලින් ගෙවිය යුතු ය. නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

(ඇ) එක් එක් මාසය තුළ සපයනු ලබන ජලය වෙනුවෙන් අයිතිකරු විසින් ගැලුම් දාහකට රුපියල් ———— (රු.————) බැගින් නගර සභාවේ කොමසාරිස්ට ගෙවිය යුතුය. නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය. පළමු වැනි ගෙවීම ———— මාසයේ පළමුවැනි දා කළ යුතු ය.

3. ජල මාපක යන්ත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද හෝ ජලය වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව නියමිත දිනයේ සිට පහළොස් දවසක් ඇතුළත දී නගර සභාවේ කොමසාරිස් වෙත නො ගෙවුව හොත් ජල සේවය පාවිච්චි කිරීමට ඇති අයිතිවාසිකම් සභාව සතු කරගත යුතුවාක් හැර, ජල සේවය නැවැත්වීම ද නගර සභාව විසින් කළ හැකිය.

4. ගිවිසුම අවසන් කර ගැනීමට අදහස් කරන බැව් එක් පාර්ශ්වයක් විසින් අනික් පාර්ශ්වයට තිස් දවසකට කලින් දැන්වීමෙන් කිනම් පාර්ශ්වයකට වුවද ඒය අවසන් කර ගත හැකිය. එසේ ගිවිසුම අවසන් කර ගත හොත්, අළුතෙන් ගිවිසුමකට බැඳෙන තුරු ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට ජල සේවය පාවිච්චි කිරීමට අයිතිවාසිකමක් නො තිබිය යුතුය.

5. පදිංචිකරුවන් වෙනස් වීමට ආසන්න වූ ක්වර අවස්ථාවක වුවද, ඒ බව අයිතිකරු විසින් කල් ඇතිව දැන්විය යුතුය. එසේම ඉහත සඳහන් කොන්දේසි පිළිගැනීමට කැමති බව ලියවිල්ලකින් දන්වන තුරු ජල සේවය පාවිච්චි කිරීමට කිසිම පදිංචිකරුවකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුයි.

6. ජල සම්පාදනයට අදාළව සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් විධි විධාන මෙම ගිවිසුමේ ම කොටසක් වශයෙන් සැලකිය යුතුය.

එක් දහස් නවසිය ———— වූ ————, මස—— වැනි දින වූ මෙදින ———— දී අත්සන් කරන ලදී.

————,
අයිතිකරු.

————,
කොමසාරිස්, යාපනය මහා නගර සභාව.

අත්සන් සහතික කළ බව සාක්ෂිකරුවෝ :—

(1) ————,

(2) ————.

"ඇ" ආකෘති පත්‍රය

(42 වන අතුරු ව්‍යවස්ථාව)

අංකය :————.

19 ———— මස ———— වන දින,
යාපනය,
මහා නගර සභා කාර්යාලයේ දී ය.

———— නම් වීථියේ පිහිටි ———— වැනි අංකය දරන ස්ථානයට ———— වැනි දායින් අවසන් වන කාර්තුව තුළ සපයන ලද ජලය වෙනුවෙන් යාපනය මහා නගර සභාවට ගෙවිය යුතු ගණන් හිලව් පිළිබඳ සටහනයි.

යොමු අංකය :——— -.

ජලය පිළිබඳ ගණන් හිලව්

ජල මාපක යන්ත්‍රයෙහි සටහන් වූ ගණන් ගත් දිනය...........

පාවිච්චි කරන ලද ජලය ගැලුම් දාහකට රු. —— බැගින් රු. ශ.

ගෘහ කාර්‍යයන්ගෙන් බාහිර වූ වෙනත් කටයුතු වලට සපයන ලද්දාවූද, ජල මාපක යන්ත්‍රයෙන් නොමනින ලද්දාවූ ද ජලය අය විය යුතු මුදල ...

මෙය ලැබුණු දිනයේ සිට පහළොස් දිනක් ඇතුලත දී ඉහත සඳහන් මුදල යාපනය මහ නගර සභා කාර්යාලයට ගෙවන ලෙස මෙයින් ඔබට නියම කර සිටිමි.

————,
මහ නගර සභාවේ කොමසාරිස්.

"ඉ" ආකෘති පත්‍රය

(45 වැනි අතුරු ව්‍යවස්ථාව)

දෝෂ සහිත සේවය වෙනස් කොට හරි ගැස්සීමට කරනු ලබන දැන්වීමයි

19 ———— මස ———— වන දින,
යාපනය,
මහා නගර සභා කාර්යාලයේ දී ය.

———— නම් වීථියේ පිහිටි අංක ———— දරන ගෙයි අයිතිකරු හෝ පදිංචිකරු වෙතටයි.

ඉහත කී ස්ථානයට සවි කර ඇති වතුර පයිප්ප පරීක්ෂා කර බලන ලදුව, ඒවායෙහි යම් යම් දෝෂ තිබෙන බැව් දැන ගන්නට ලැබී තිබේ. එබැවින් ඒ සඳහා මෙහි පහත සඳහන් වෙනස් කිරීම් හෝ අළුත් වැඩියා කිරීම් අවශ්‍ය බව සහතික කර සිටින අතර, ඒ වෙනස් කිරීම් හෝ අළුත්වැඩියා කිරීම් කරවන ලෙස ද මෙයින් ඔබට දන්වා සිටිනු ලැබේ. මේ දැන්වීම් ලැබී දවස් ———— ක් ඇතුළත දී එහි වෙනස් කිරීම් හා අළුත්වැඩියා කිරීම් මා සෑහීමට පත් වන පරිද්දෙන් කරවනු නො ලැබුවහොත්, ජල කර්මාන්තයෙන් සපයෙන ජල සේවය ඉන් පසු නතර කරනු ලැබේ. මා සෑහීමට පත් වන පරිද්දෙන් නැවත පිහිටුවන ලබන තුරු හෝ වෙනස් කොට යථා තත්ත්වයට පමුණුවන තුරු හෝ අළුත් වැඩියා කරන තුරු, ඒවා නගර සභාවේ ජල කර්මාන්තයට නැවත සම්බන්ධ කරනු නොලැබේ.

————,
කොමිසාරිස්,
යාපනය මහා නගර සභාව.

වෙනස් කිරීම් සහ/හෝ අළුත්වැඩියා කිරීම :————.

4-117—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

මහ නගර සභා ආඥපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනතේ 5 වැනි වගන්තිය සමග එක්ව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥපනතේ 267 වැනි හා 272 (18) වැනි වගන්ති යටතේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව විසින් සම්පාදිතවූද, එම ආඥපනතේ 268 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද්ද වූද, අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975. 03. 13 වැනි දින,
කොළඹ දීය.

අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා 1974 (දෙහිවල-ගල්කිස්ස) සිනමා ශාලා තුල දුම්බීම තහනම් කිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

2. යම් සිනමා ශාලාවක ප්‍රේක්ෂණාගාරය තුලදී නිශ්චිත කාල සීමාවක් ඇතුලත කිසිම තැනැත්තකු විසින් දුම් පානය නොකල යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ කල්හි ඔහු රුපියල් පණහකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

4. සෑම සිනමා ශාලාවකම බලපත්‍ර දරන්නා විසින් :—

(අ) ප්‍රේක්ෂණාගාරය ඇතුලත ප්‍රකට ස්ථානවල සිංහලෙන්, දෙමලෙන් හා ඉංග්‍රීසියෙන් යටත් පිරිසෙයින් අඟල් තුනක්වත් උස පැහැදිලි අකුරෙන් "දුම්බීම තහනම්" යන වචන ඇතුලත් දැන්වීම්ද,

(ආ) සිනමා ශාලාවේ බාහිර කොටසේ ප්‍රකට ස්ථානයක "ප්‍රේක්ෂණාගාරය ඇතුලත දුම්බීම තහනම්" යන වචන ඇතුලත් දැන්වීමක්ද,

ප්‍රදර්ශනය කල යුතුය.

5. නිශ්චිත කාල සීමාව තුලදී ප්‍රේක්ෂණාගාරය ඇතුලත කිනම් හෝ ආකාරයක දුම්කොල විකිණීම හෝ විකිණීමට ඉඩ දීම ඔහු විසින් නොකල යුතු බව සෑම සිනමා ශාලාවකම බලපත්‍ර දරන්නකු වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක අඩංගු කොන්දේසියක් විය යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල :—

"සිනමා ශාලාව" යන්නෙන් සිනමා යන්ත්‍රයක් හෝ මැජික් ලන්තෑරුමක් හෝ එවැනි වෙනත් උපකරණයක් මාර්ගයෙන් පින්තූර හෝ දෘෂ්ටිවිෂක රංගප්‍රයෝග මහජනයාට ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ලද ගොඩනැගිල්ලක් අදහස් වේ.

"නිශ්චිත කාල සීමාව" යන්නෙන් යම් මහජන ප්‍රදර්ශනයක් ආරම්භ කිරීමට විනාඩි 30 කට කලින් පටන්ගෙන එම මහජන ප්‍රදර්ශනය නිම වෙනවාත් සමගම, අවසන්වන හා එම මහජන ප්‍රදර්ශනය පවත්නා මුලු කාලයද ඇතුලත් වන කාල සීමාව අදහස් වේ.

"දුම්බීම" යන්නෙන් සුරුට්ටු, සිගරැට්, බීඩි හෝ වෙනත් යම් ආකාරයකින් හෝ දුම්කෝවක (පයිප්පයක) ගබු ගුඩාවක ආධාරයෙන් හෝ වෙනත් ආකාරයකින් දුම්කොළ පාවිච්චි කිරීම අදහස් වේ. තවද,

"ප්‍රසිද්ධ රඟ දැක්වීම" යන්නට (176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥපනතෙහි ඒ සඳහා දී ඇති අර්ථයම යෙදේ.

4-116—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

### දේපල විකිණීම

### කඩුගන්නාව නගර සභාව

### හිඟවරිපනම් නොගෙවීම නිසා නිශ්චල දේපල විකිණීම

1974/2 වැනි කාර්තුව දක්වා, මීට යාව ඇති උපලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු අයකර ගැනීම පිණිස තහනමට ගැනීමට චංචල දේපල නොමැතිවූ හෙයින්, 255 අධිකාරය වන් නගරසභා ආඥාපනතේ 170(1) 170(2) යන ඡේදයන් සමග කියවෙන 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 252 ඡේදය ප්‍රකාර මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ (2) දුව සහ උපදින ද්‍රව්‍ය (3) ගොඩනැගිලි සහ උපකරණ සහ පහත සඳහන් වන දේපලම ඒ ඒ දේපල වෙනුවෙන් අයවියයුතු වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත් පහත සඳහන් උපලේඛණයේ දක්වා ඇති දිනයන්හිදී පෙ. ව. 9ට හෝ ඊට පසුව ආරම්භකොට, එකී දේපල පිහිටි ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

එච්. ඇම්. කරුණාතිලක,
ලේකම්,
නගර සභාව කඩුගන්නාව.

1975 මාර්තු මස 24 දින,
කඩුගන්නාව,
නගර සභා කාර්යාලය.

උපලේඛනය

කොට්ඨාශ අංක 3—1975.04.28
නුවරපාර අංක 40.
කොට්ඨාශ අංක 4—1975.04.28
නුවරපාර අංක 198 (ඒ) 200, 202
කොට්ඨාශ අංක 6—1975.04.29
නුවරපාර අංක 273, 275, 293.

4-106—75. 04. 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

### විශේෂ කොමසාරිස් කාර්යාලය—පුස්සැල්ලාව නගරය

### ජලභීතිකා රෝගය

පුස්සැල්ලාව නගර සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඟමතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයේ පලවන දින සිට ඉදිරියට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ව. කීර්ති විශ්වනාථ,
විශේෂ කොමසාරිස්—පුස්සැල්ලාව නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
පුස්සැල්ලාව.
1975. 03. 19 දින.

4-67—75. 04. 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### මැදගම්පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරය) 17(1) දරණ උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලයේ පරිදි නියමිත අධිකාරි නැන වූද, මැදගම්පත්තු ගම්ප්‍රදේශයේ පරිපාලන නිලධාරි නැනවූද පී. කේ. රොඩ්රිගො වන මම 1975 වෂියේදී පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් දිනවල මැදගම්පත්තු ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

උපලේඛනය

1975 මාර්තු 26—පසලොස්වක
1975 මාර්තු 28—මහ සිකුරාද
1975 අප්‍රේල් 11—අමාවක
1975 අප්‍රේල් 25—පසලොස්වක
1975 මැයි 11—අමාවක
1975 මැයි 22—ජනරජ දිනය
1975 මැයි 24—වෙසක් පසලොස්වක් දිනය
1975 මැයි 25—වෙසක් දිනට පසු දිනය
1975 ජූනි 10—අමාවක
1975 ජූනි 23—පසලොස්වක
1975 ජූලි 9—අමාවක
1975 ජූලි 22—පසලොස්වක
1975 අගෝස්තු 7—අමාවක
1975 අගෝස්තු 21—පසලොස්වක
1975 සැප්තැම්බර් 6—අමාවක
1975 සැප්තැම්බර් 19—පසලොස්වක
1975 සැප්තැම්බර් 26—බණ්ඩාරනායක අනුස්මරණ දිනය
1975 ඔක්තෝබර් 4—ලෝක සත්ව දිනය
1975 ඔක්තෝබර් 5—අමාවක් දිනය
1975 ඔක්තෝබර් 19—පසලොස්වක
1975 නොවැම්බර් 3—අමාවක
1975 නොවැම්බර් 18—පසලොස්වක
1975 දෙසැම්බර් 3—අමාවක
1975 දෙසැම්බර් 18—පසලොස්වක

පී. කේ. රොඩ්රිගො,
පරිපාලන නිලධාරී,
මැදගම්පත්තු ගම්ප්‍රදේශය.

1975. 03. 18 දින, මැදගම,
පරිපාලන නිලධාරි කාර්යාලයේ දීය.

4-51—75. 04. 04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### පා : දු : පලිස්පත්තුව බටහිර ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත (272 අධිකාරය)

ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නිසි බලධරයාවූද, පා: දු: පලිස්පත්තුව බටහිර ගම්සභාවේ සභාපතිවූද, ඇම්. ජේ. බී. ඒකනායක වන මම, 1975 වර්ෂයේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී පා: දු: පලිස්පත්තුව බටහිර ගම්සභා සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් වෙළඳම හෝ මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම මෙයින් තහනම් කරමි.

උපලේඛණය

1975 ජනවාරි 5, 12, 20, 27
1975 පෙබරවාරි 3, 11, 19, 25
1975 මාර්තු 5, 13, 21, 26
1975 අප්‍රේල් 3, 11, 19, 25.

1975 මැයි 3, 11, 18, 24

1975 ජූනි 2, 10, 16, 23

1975 ජූලි 1, 9, 16, 22, 31

1975 අගෝස්තු 7, 14, 21, 30

1975 සැප්තැම්බර් 6, 12, 19, 28

1975 ඔක්තෝබර් 5, 12, 19, 28

1975 නොවැම්බර් 3, 10, 18, 26

1975 දෙසැම්බර් 3, 10, 18, 25

ඇම්. ජේ. බී. ඒකනායක,
සභාපති,
පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභාව.

1975 මාර්තු මස 21 වැනි දින,
පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභා කාර්යාලයේදීය,
දිගන, කෙන්ගල්ල.

4-50 —75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත"

කනංකෙ ගම් ප්‍රදේශය

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 3 වන වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කනංකෙ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

යෝජනාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කාණ්ඩයෙහි, අප්‍රිය වූ අන්තරා දායකවූ කර්මාන්ත විලට අදාල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කරමින් (261 වන අධිකාරිය) පළාත් පාලන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 2 වැනි සහ 4 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පිළියෙල කොට එම පණතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ අංක 215 සහ 216 පිටුවල අන්තර්ගත කොට ඇති ගම්සභා සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා යටතේවූ උප ලේඛනයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කොටස්වල පිළිවෙළින් සඳහන් 'අන්තරාදායක' 'අප්‍රසන්න' සහ 'අන්තරාදායක හා අප්‍රසන්න' කර්මාන්ත මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට මාතර දිස්ත්‍රික්කයේ කනංකෙ ගම් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක විය යුතු බවට කනංකෙ ගම්සභාව මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. කේ. ඊ. පියසේන,
කනංකෙ ගම්සභාවේ සභාපති.

1975 ජනවාරි මස 30 දින,
කනංකෙ ගම්සභා කාර්යාලය,
හේනේගම, අකුරැස්ස.

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණත) (261 වන අධිකාරිය)

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණතේ 3 වන වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කනංකෙ ගම්සභාව විසින් එකී ප්‍රදේශය තුළ පණවා ක්‍රියාත්මක කළයුතු වූ විවිධ බලපත්‍ර ගාස්තු හා බදු පිළිබඳව සභා සම්මත කර ගනු ලැබූ යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මහජනයාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ 1953 අප්‍රේල් මස 10 වන දිනැති අංක 10,517 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1973 අගෝස්තු මස 7 වන දිනැති අංක 10,560 දරණ රජයේ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, (අංක 1 සහ 37 වන කාණ්ඩ දෙකම ඇතුළුව.)

පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමන් විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 දිනැති අංක 13,679 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1969 ජනවාරි මස 8 වන දිනැති අංක 14,287 දරණ රජයේ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 38 දරණ කාණ්ඩය ද,

පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමන් විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූනි මස 8 වන දිනැති අංක 14,703 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි මස 3 වන දිනැති අංක 14,835 දරණ රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වන කාණ්ඩ දෙකම ඇතුළුව).

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමන් විසින් සම්පාදනය කරනු ලැබ 1972 නොවැම්බර් මස 3 වන දිනැති අංක 32 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වන කාණ්ඩයේ පළ කරන ලද්දාවූ ද, ජාතික රාජ්‍ය සභාවේ යෝජනාවකින් එය අනුමත කර ඇතැයි 1973 ජූනි මස 29 වන දිනැති අංක 66 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 දරණ කාණ්ඩය යටතේවූ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවද,

මෙකී තීරණය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට ක්‍රියාත්මක වන අයුරින් පිළිගැනීමටද; මාතර දිස්ත්‍රික්කයේ කනංකෙ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ 5 වන වගන්තියේ (I) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. කේ. ඊ. පියසේන,
කනංකෙ ගම්සභාවේ සභාපති.

1975 ජනවාරි මස 30 දින,
කනංකෙ ගම්සභා කාර්යාලය,
හේනේගම, අකුරැස්ස.

4—38—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත (261 වෙනි අධිකාරය)

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහ (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥපනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

යෝජනාව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, ජාතික රාජ්‍ය සභාව විසින් 1973.04.05 වැනි දින අනුමත කරන ලද බව 1973.06.29 වැනි දින අංක 66 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 වැනි කාණ්ඩය වූ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත් එය ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පලවන දින සිට කුරුණෑගල දිස්ත්‍රික්යේ නාරම්මල ගම්සභා ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට එකී නාරම්මල ගම්සභාව විසින් 261 වන අධිකාරිය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ආර්. ඇම්. කීරිබණ්ඩා,
සභාපති,
නාරම්මල ගම්සභාව.

1975 මාර්තු මස 19 වැනි දින,
නාරම්මල ගම්සභා කාර්යාලයේදීය.

4-48—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### දකුණු විලච්චිය කෝරළේ ගම් සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය ඊට ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන දකුණු විලච්චිය කෝරළේ ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමණ කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්. අප්පුහාමි,
සභාපති,
ද. වි. කෝ. ගම් සභාව.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. එස්. එල්. අබුතාහිර්... | හරක් මස් ... | නොච්චියාගම |

4–43/1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### දකුණු විලච්චිය කෝරළේ ගම් සභාව

#### ගෝ ඝාතන ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වන අධිකාරය) 17(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වූ ද දකුණු විලච්චිය කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සභාපති වන වන්නිහාමිගේ අප්පුහාමි වන මම 1975 වර්ෂයේදී පහත සඳහන් දින වලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු විලච්චිය කෝරළේ ගම් ප්‍රදේශ සීමාව තුල මස් පිණිස සතුන් මැරීම, මස් වෙළදාම් කිරීම සහ වෙළදාම පිණිස ප්‍රදර්ශනය කිරීම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 4, 11, 20, 26
1975 පෙබරවාරි 2, 10, 10, 12, 25
1975 මාර්තු 4, 11, 20, 26
1975 අප්‍රේල් 3, 10, 18, 25
1975 මැයි 2, 10, 18, 24
1975 ජූනි 1, 8, 16, 22
1975 ජූලි 1, 8, 15, 22, 30
1975 අගෝස්තු 6, 13, 20, 29
1975 සැප්තැම්බර් 5, 12, 19, 26, 28
1975 ඔක්තෝබර් 4, 1, 19, 27
1975 නොවැම්බර් 2, 10, 18, 25
1975 දෙසැම්බර් 10, 18, 25, 31

ඩබ්. අප්පුහාමි,
සභාපති,
ද. වි. කෝ. ගම් සභාව.

1975 මාර්තු මස 20 වැනි දින,
නොච්චියාගම ගම් සභා කාර්යාලයේදී ය.

4–43/2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

#### 1975 වර්ෂය සඳහා වූ තක්සේරු බදු ලේඛණ

1975 වර්ෂය සඳහා මෙම නගරයේ වරිපණම් බදු ලේඛණ දැනට පිළියෙලකර ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේ දී, බදු ගෙවන්නන් විසින් පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපණතේ 166 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරිය වූ මහනගර සභා ආඥාපනතේ 235 (1) සහ (2) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. සැන්ව. එස්. පෙරේරා.
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1975 මාර්තු මස 20 වැනි දින,
බණ්ඩාරවෙල නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

4–49—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා—261 වැනි අධිකාරය

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ) අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල උඩුගහ පත්තු ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

#### යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 08 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩල යේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 03 වෙනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්ද වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 39 සිට 41 දක්වා වූ කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කණ්ඩ දෙකම ඇතුලත්ව 1973 ජනවාරි මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද) මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල උඩුගහ පත්තු ගම් සභාව විසින් ප්‍රාදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පිළිබඳ ආඥාපනතේ (261 වැනි අධිකාරය) (3) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ඇල්. ඈෂ්. අල්විස්.
පාලන නිලධාරි,
හංවැල්ල උඩුගහ පත්තු ගම් සභාව.

1975 මාර්තු මස 20 වැනි දින,
කොස්ගම-බොරලුගොඩ පිහිටි,
ගම්සභා කාර්යාලයේ දිය.

4-61—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### කෑගල්ල නගර සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කෑගල්ල නගර සභා සීමාව තුල යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ නම් අසුවල් කරුණ මත යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| 1. ෂෙරීප් ඒ. කාදර් ... | ගවමස් කඩය, අංක 8, බස් නැවතුම්පල අසල ප්‍රසිද්ධ වෙළඳ සැල. |
| 2. ඇම්. ඩී. ජෝෂප් අප්පුහාමි ... | ගවමස් කඩය, අංක 9 බස් නැවතුම්පල අසල ප්‍රසිද්ධ වෙළඳ සැල. |

පු. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල නගර සභාව.

1975 මාර්තු මස 20 දින,
කෑගල්ල, නගර සභා කාර්යාලයේ දිය.

4-65—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**
**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැළකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ, ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.10 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය,

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රය පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | 07.03.75 | සිකුරාද | 28.02.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 14.03.75 | සිකුරාද | 07.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 21.03.75 | සිකුරාද | 14.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | 21.03.75 | සිකුරාද | දවල් | 12.00 |
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 11.04.75 | සිකුරාද | 04.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.04.75 | සිකුරාද | 11.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 18.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 09.05.75 | සිකුරාද | 02.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 16.05.75 | සිකුරාද | 09.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 23.05.75 | සිකුරාද | 16.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 30.05.75 | සිකුරාද | 23.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 30.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 13.06.75 | සිකුරාද | 06.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 20.06.75 | සිකුරාද | 13.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.06.75 | සිකුරාද | 20.06.75 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුවේ මුද්‍රණය කරන ලදී